# දිසි විදැසි

## පද්‍යකාව්‍ය සංග්‍රහය

ප්‍රකාශනය
පීඨ ප්‍රකාශන කමිටුව
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# දිසි විදැසි

## පද්‍යකාව්‍ය සංග්‍රහය

**ප්‍රකාශනය**

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ගංගොඩවිල, නුගේගොඩ

2020

# දිසි විදැසි
## පද්‍යකාව්‍ය සංග්‍රහය

**සංස්කරණය**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ

**සංස්කරණ සහාය**
කථිකාචාර්ය චරිතා පබසරණි මාකස්

**ප්‍රකාශනය**
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ
2020

## දිසි විදැසි පද්‍යකාව්‍ය සංග්‍රහය

© සංස්කාරක : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ
සංස්කරණ සහාය : කථිකාචාර්ය චරිතා පබසරණී මාකස්

ප්‍රථම මුද්‍රණය 2020

ISBN 978-624-5360-13-0

පිටකවරය නිර්මාණය : පැතුම් නිමන්ත

පරිගණක පිටු සැකසුම : විජේවර්ධන ක්‍රියේෂන්ස්

ප්‍රකාශනය : මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

මුද්‍රණය : සයිබර්ගේට් සර්විසස් (ප්‍රයිවට් ලිමිටඩ්)
ශ්‍රී සෝරත මාවත,
ගංගොඩවිල, නුගේගොඩ.

**පූජා**

කොවිඩ් - 19
කොරෝනා වසංගත සමයේ
රටක් සුවපත් කරන්නට
දිවා රෑ වෙහෙසුණු
සුව සේවයට
හා
**ආරක්ෂක සේවයට**

# නිර්මාණාත්මක කුශලතා, සමාජ යහපත වෙනුවෙන් ඉදිරිපත් කිරීමට තනාදුන් සහෘද වේදිකාව 'දිසි විදැසි'

දශක සැටකට අධික කාලයක් ශ්‍රී ලංකා උසස් අධ්‍යාපනයේ නිම් වළලු පුළුල් කරමින් ද, උගත්, නැණ, බල සපිරි පරපුරක් දැයට දායාද කරමින් ද, කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඓතිහාසික කාර්යභාරයක නිරත වේ. වර්තමානය වන විට අධ්‍යයන පීඨ අටකින් සුසංවිධානවත්ව යුග මෙහෙවරක නිරත වන ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ පෙරගමන්කරුවකු වශයෙන් කැපී පෙනෙන කාර්යභාරයක මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය නිරතව ඇති බව දන්වන්නේ ඉමහත් සතුටකිනි.

පර්යේෂණ, ප්‍රකාශන, විද්‍යා, ශාස්ත්‍ර ඈ ක්‍රමවේද ඔස්සේ ඥාන ගවේෂණයේ හා බෙදාහැරීමේ කටයුතු වෙනුවෙන් කැපවුණු අතීත විද්‍යෝදයේ වර්තමාන සාඩම්බර උරුමකරුවන් වශයෙන් සියවසේ ගෙවී ගිය තීරණාත්මක කාලයේ දී ද පීඨයක් වශයෙන් මෙන්ම ජාතික විශ්වවිද්‍යාලයක් වශයෙන් ද වත්මන් දරු පරපුර වෙනුවෙන් සිය වගකීම නොපිරිහෙළා ඉටු කිරීමට හැකි වීම අප ලද භාග්‍යයකි. කොවිඩ් 19 රෝග ව්‍යාප්තියක් සමඟ ශක්තිමත් රාජ්‍යය පවා බිඳවැටෙමින් බල රහිත වන විට කුඩා රටක් වුවත් සිය ශක්‍යතාව මනාව පෙන්වා ලූ ශ්‍රී ලංකා රාජ්‍යයට සහ එහි පෙරගමන්කරුවන්ට අවැසි ශක්තිය සැපයීමට අපට එයින් හැකිවිය. නව තාක්ෂණය හා තොරතුරු තාක්ෂණයේ සුහුරු භාවිතාවන් කාලෝචිතවත් අවස්ථෝචිතවත් යෙදවීමෙන් වත්මන් ශ්‍රී ජයවර්ධනපුර විද්‍යාර්ථීන්ට සිය අධ්‍යයන හා පර්යේෂණ කාර්යයන්ගෙන් දුරස්වන්නට නොදී ළෙන්ගතු කර ගැනීම සඳහා

පීඨයක් වශයෙන් අප ගත් වෙහෙස අතිමහත් ය. දූරස්ථ අධ්‍යාපන ක්‍රමවේද ඔස්සේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යමින් ද, ඇති වූ සමාජ ආර්ථික වටපිටාව මත ගොඩනැගුණු මානසික අවපීඩනය අවම කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙමින් ද සහයෝගයෙන් සහෝදරත්වය පෙරදැරිව අප ශිෂ්‍ය ප්‍රජාව වෙත ප්‍රවේශ වීම ම එහි සාර්ථකත්වය මනාව පිළිබිඹු කරයි.

අධ්‍යයන කටයුතු පසුපසට යාම වැළැක්වීම පමණක් නොව ඇතැම් සිසු දරුවන් මුහුණ දුන් ආර්ථික දුෂ්කරතා උදෙසා හැකි අයුරින් සහයෝගය දැක්වීමට ද අපි උපරිමයෙන් කටයුතු කළෙමු. එයිනිදු නොනැවතුණ අප ජයවර්ධනපුර සිසු ප්‍රජාව වෙනුවෙන් පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකේය ප්‍රජාව වෙනුවෙන් සමාජ මාධ්‍ය ඔස්සේ සමාජ අවපීඩනය අවම කරගැනීම සඳහා ප්‍රමුඛ ව කටයුතු කරනු ලැබූයේ එය යුගයේ අවශ්‍යතාවක් බව හඳුනාගත් නිසා ය. එහි එක් ප්‍රතිඵලයක් ලෙස  බිහි වූ 'දිසි විදැසි'' නිර්මාණාත්මක අදහස් පෙළහර ඉදිරියෙන් ම පසුවන්නේ, ඒ වනාහි, නිර්මාණාත්මක කුශලතා පසුගාමී නොකර සමාජ යහපත වෙනුවෙන් ඉදිරිපත් කිරීමට, අප තනා දුන් සහෘද වේදිකාවක් වූ බැවිනි. පීඨ ප්‍රජාවගේ නිර්මාණාත්මක කෞශල්‍යය වියැකී යා නොදී කොරෝනා සමයේ ඔබ ලබා දුන් නිර්මාණ, සාර සංග්‍රහයක් ලෙස මෙලෙස එළි දැක්වීමට හැකි වීම පශ්චාත් කොරෝනා මෙහෙවරෙහි අග්‍ර ඵලයකි. ඒ සඳහා නිර්මාණ ඉදිරිපත් කරමින් ද, නිර්මාණ සංස්කරණයෙන් ද, වඩා ආකර්ෂණීය ලෙස සමාජගත කිරීමෙන් ද වශයෙන් නේකවිධ අයුරින් දායක වූ සියලු පාර්ශ්වකරුවන්ට හද පිරි ශුභාශිංසන එක් කරනුයේ සාමූහික කාර්යයක සාර්ථක ප්‍රතිඵල ඔබ දෑස මානයේ යථාර්ථයක් කිරීමට අප ගත් වෙහෙස පිළිබඳව නිරාමිස සතුටක් ද ඇතිවය.

මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද
පීඨාධිපති
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**



# කොවිඩ්-19 වසංගත සමයට නව අරුතක් එක් කළ 'දිසි විදැසි'

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ ප්‍රකාශන දිනය නිමිත්තෙන් පළ කරනු ලබන 'දිසි විදැසි - පද්‍යකාව්‍ය සංග්‍රහය' වෙනුවෙන් ශුභාශිංසන එක් කරනුයේ ඉමහත් සතුටිනි. සාහිත්‍ය මාසය නිමිති කොට ගනිමින් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ, අධ්‍යයන, අනධ්‍යයන හා ශිෂ්‍ය විද්‍යාර්ථීන් විසින් ප්‍රකාශිත කෘති ඇගයීමට ලක් කරනු පිණිස 'පීඨ ප්‍රකාශන දිනයක්' මෙසේ සංවිධානය කරනු ලබන්නේ ප්‍රථම වරට යි. දිසි - විදැසි නමින් පීඨ ප්‍රකාශනයක් ලෙස මේ එළි දකින්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය මානවකමානවිකාවන් සිය විශ්වවිද්‍යාලයීය ප්‍රියයන්ගෙන් වෙන්ව හුදකලාව දිවි ගෙවූ සමයක ඔවුන් වෙතින් බිහි වූ නිර්මාණ සමුච්චයයි.

කොවිඩ්-19 හේතුවෙන් 2019 මාර්තු මස සිට සමස්ත ශ්‍රී ලංකාව වසා දමද්දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය සැබැවින් ම වසා දැමුවේ නැත. භෞතික ව වසා දැමුවත් නිර්මාණකරුවන්ගේ සිතිවිලිවලට අගුළු දැමිය හැකි ද? අප විද්‍යාර්ථීන්ගේ සිතිවිලි අවදි කරන ලද්දේ පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද මහාත්මා විසිනි. ඒ අනුව එක් දිනක අන්තර්ජාලය ඔස්සේ ගලා එන  නිර්මාණ රාශිය අතුරින් දවසේ හොඳම නිර්මාණය තෝරා එයට අන්තර්ජාල තෑග්ගක් ද පිරිනැමිණි. අද දිසි විදැසි නමින් එළි දකින්නේ කොවිඩ් - 19 වසංගත සමයෙහි අන්තර්ජාලයෙහි සැරිසැරූ එම ජයග්‍රාහක නිර්මාණ සමුච්චය යි.

කොවිඩ්- 19 වසංගත සමයට නව අරුතක් එක් කරමින් වසා තිබූ හදවත් කවුළු විවර කොට මේ කටයුත්තට සංස්කරණ දායකත්වය සැපයුවේ සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ සහ කථිකාචාර්ය චරිතා මාකස් යන දෙපළ යි. මේ දෙපළ විසින් තෝරා දෙන ලද නිර්මාණ දැක බලාගැනීමට නිරෝධායන සමයෙහි උදෑසන වන තෙක් අපි බලා සිටියෙමු.

දිසි විදැසි නිර්මාණ සංග්‍රහයට අමතරව විද්‍යාර්ථීන් විසින් 'රන්රසු ප්‍රතිභා අභිනන්දන කලා මංගල්‍යය - 2019' සඳහා ඉදිරිපත් කරන ලද කෙටිකතා හා කාව්‍ය අතුරින් අවසන් වටය සඳහා තෝරාගත් නිර්මාණ ඇතුළත් කෘතියක් ද මෙදින ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අප පීඨයෙහි කටයුතුවලට නිරන්තරයෙන් සහයෝගය දක්වන උපකුලපති ජ්‍යේෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහාත්මාටත්, මේ කර්තව්‍යය සාර්ථක කරගන්නා තෙක් නොඉවසිලිමත්ව අපව මෙහෙය වූ පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද මහාත්මා ප්‍රමුඛ පීඨ ප්‍රකාශන කමිටුවටත්, මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨයෙහි කාර්ය මණ්ඩලයටත් අපගේ ප්‍රණාමය හිමිවෙයි.

දිසි විදැසිවලින් පමණක් නොනැවතී එළඹෙන වසරේ තම නිර්මාණ කෘතිවලින් පීඨ ප්‍රකාශන කමිටුව සරුකරන්නට නිර්මාණකරුවනට ශක්තිය ලැබේවා! යි යනු අපගේ හෘදයාංගම ප්‍රාර්ථනය යි.

ආචාර්ය කුසුමලතා ලංකාමුල්ල
සභාපති
පීඨ ප්‍රකාශන කමිටුව



# සංස්කාරක සටහන

ගෙවුණු අනපේක්ෂිත වාතාවරණය හමුවේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සිසු සිසුවියන්ගේ නිර්මාණාත්මක කුසලතා ඔප් නැංවීමේ අරමුණ පෙරදැරිව අපි " දිසි විදැසි" ආරම්භ කළෙමු. එම නිර්මාණ කාර්යය 2020 අප්‍රේල් 03 වැනිදායින් ආරම්භ වී මැයි 31 වැනිදායින් අවසන් විය. මෙහි අන්තර්ගත වන්නේ "දිසි විදැසි" යටතේ පීඨ වෙබ් පිටුවේ සහ මුහුණු පොතේ පළ වූ නිර්මාණ සංග්‍රහය යි. මෙහි අන්තර්ගත වූ සියලු නිර්මාණ කවීත්වයෙන් හා ප්‍රතිභාවෙන් අනූන ඒවා යැයි අපි නො කියමු. ඇතැම් නිර්මාණ සැබවින්ම වෙසෙස් කවිතාවෙන් යුතු බව පැවසිය යුතු ය. එහෙත් මෙහිලා අපගේ වෑයම වූයේ කොවිඩ් - 19 හෙවත් කොරෝනා වසංගත සමයේ බිඳ වැටුණු අප සිසුන්ගේ මනස නිර්මාණ කාර්යයක් සඳහා යොමු කරවීම ය. එහි දී අපගේ අපේක්ෂාව වූයේ පැවති වසංගත සමය හා බැඳුණු නිර්මාණ එළි දැක්වීම යි. එ පරිද්දෙන් ම විවිධ විෂයයන් හදාරන අප දරු දැරියෝ ඔවුන් ඇසූ, දුටු, දැනුණු දේ කවියට නගා අප වෙත එවූහ. ඡායාරූපයට නැගූහ. අපි ඔවුන් ලියූ එකදු වචනයක් හෝ වෙනස් කිරීමට උත්සාහ නො කළෙමු. දිසි විදැසි ලෙස මෙසේ පළවන්නේ ඔවුන් ලියූ දෑ පමණි. මේ කවි මගින් අංකුර කවීන්ගේ ඡායාමාත්‍ර ඔබට හමුවනු ඇත. ඇතැම් කවියක, කාව්‍ය ලක්ෂණ නොදැක, මේවා සරසවි සිසුන්ගේ කවිදැ?යි ප්‍රශ්න කිරීමට ඔබ පෙළඹෙනු ඇත. එහෙත් මේ වනාහි අප රට පමණක් නො ව මුළු ලොව ම වසා පැතිරුණු තවමත් සම්පූර්ණයෙන් ම පහ ව නො ගිය අඳුරු කාල පරිච්ඡේදයක සංක්ෂිප්ත සටහනකි. මෙහිලා දැකිය හැකි වන්නේ ඔවුන් පෙළූ හීතිය යි; සංත්‍රාසයයි; වේදනාවයි; තනිකමයි.

ඔවුන් අත්විඳි ඒ හැඟීම් සමුදායෙන් ඔබ විඳින්නේ මේ මොහොතේදීත් අපට අමතක ව ගිය ඒ අඳුරු කාල වකවානුවයි; ඒ අඳුරු යුගය විනිවිද දුටු ඔවුන්ගේ සොඳුරු කවි හිතයි. එහෙයින්

අප උත්සාහ දැරුවේ මේ කවිවල සැඟවුණු සමාජ යථාර්ථය උකහා ගැනීමට පමණි. එහි අඩු ලුහුඬුකම් දැකීම පසෙකලා ඔවුන්ගේ නිර්මාණශීලිත්වය අගය කිරීමට පමණි. ඇතැම්විට ඔවුන්ගෙන් ඇතැමකුගේ කවියක් මුල් වරට පළ වන්නේ මේ නිර්මාණ සංග්‍රහයේ පමණක් විය හැකි ය. තව ද වෙසෙසින් සඳහන් කළ යුතුවන්නේ මෙහි ඇතුළත් වන නිර්මාණවල භාෂා භාවිතය හා පද බෙදීම් සිදුකර ඇත්තේ ඒ ඒ නිර්මාණකරුවන්ගේ අභිමතාර්ථය අනුව බව ය.

ඒ කෙසේ වුවද මේ වනාහි මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ සිසු සිසුවියන්ගේ නිර්මාණශීලී ප්‍රයත්නයකි. එසේ ම එබඳු කර්තව්‍යයකට උර දුන් එකම පීඨය වන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය පමණි. එකී සත් කාර්යයට උරදුන් උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතාත්, පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද මහතාත්, 'දිසි විදූසි' නාමය මේ සඳහා යෝජනා කළ පීඨ ප්‍රකාශන කමිටුවේ සභාපතිනි ආචාර්ය කුසුමලතා ලංකාමුල්ල මහත්මියත්, මේ කවි වෙබ් පිටුවේ වේලාව නො වරදවා පළ කිරීමට වෙහෙස වූ ආචාර්ය තාරකා ආනන්ද මහත්මියත්, සම්බන්ධීකරණ කටයුතු සිදුකළ ආචාර්ය නිමල් මෙන්ඩිස් මහතාත්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඉමංගා නදීෂාණී මෙනවියත්, අප පීඨයේ සහකාර මූල්‍යාධිකාරිනී ලලනි ප්‍රියන්තිකා මහත්මියත්, සෝදුපත් බැලීමෙන් අපට සහාය වූ සහකාර කථිකාචාර්ය භාග්‍යා දිල්හානි මාඹුලගේ මෙනවියත්, අවසාන මොහොතේදී සියලු වැඩ රාජකාරි පසෙක තබා අපට සහාය වූ කුමාරි විජේවර්ධන මහත්මියත්, අප වෙත නිර්මාණ එවූ සියලු දෙනාත් කෘතඥතා පූර්වක ව සිහිපත් කරමු.

2020. 09. 30
හංසමාලා රිටිගහපොළ hansamala@sjp.ac.lk
චරිතා පබසරණී මාකස් marcus@sjp.ac.lk
සංස්කරණ කමිටුව
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ දී ය.



# පෙළ ගැස්ම


නිර්මාණාත්මක කුශලතා, සමාජ යහපත වෙනුවෙන් ඉදිරිපත් කිරීමට තනාදුන් සහෘද වේදිකාව 'දිසිවිදැසි' 7
මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද

කොවිඩ්-19 වසංගත සමයට නව අරුතක් එක් කළ 'දිසි විදැසි 9
ආචාර්ය කුසුමලතා ලංකාමුල්ල

සංස්කාරක සටහන 11

පෙළ ගැස්ම 13

වසංගතයේ අර්ථය සාහිත්‍යමය ඇසින්: ඇල්බෙයා කැමූගේ ''ද ප්ලේග්''නවකතාව ඇසුරින් නව කොරෝනා වසංගතය නැවත විමසා බැලීම 17
කථිකාචාර්ය චරිතා පබසරණී මාකස්

දිසි විදැසි කවිකම් - කාව්‍ය සංකල්පනා විමසුම 35
ජ්‍යෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ

1. ජීවක මහිම 54
2. කොරෝනා කාලේ ආලේ 55
3. වෙදැදුරනි පින් බෝම 56
4. කොරෝනා හා ඩේ කෙයාර් දරුවෝ 57
5. ''සියලු පොලිස් නිලධාරීන්ගේ නිවාඩු අවලංගු කෙරේ'' - පුවතක් 58
6. රකිමි මව් බිම 58
7. තනි කළා නෙවෙයි අම්මේ 59
8. වසන්තය යළි එන්න 60

9. එසේම වේවා 61
10. කොරෝනා විලංගුව 62
11. බලා ඉන්නම් අම්මේ 63
12. නොකියාම ආපු ඔයාට 64
13. කොරෝනා නුඹ සිත යළි පැරුවේ ය. 64
14. හුදෙකලා විය සැවොම 65
15. අ-සුන්දර කොරෝනාව 66
16. කොරෝනා හැමතැනම 67
17. ගැබ්බර මවකගේ සිතුවිල්ලක් 67
18. කොවිඩ් වසංගතය 68
19. නිරෝධායනය 69
20. මිහිකත් මවුනි සමාවෙන්න 70
21. හිනැහෙමු වස්සානෙට 71
22. ජපුර අම්මට ලියන වග නම් 72
23. පොඩි එකී අඳුරට බයයි 73
24. රොබරෝසියා නුඹ 74
25. සරදම් 74
26. මැව්වේ සිහින ළං වෙන්නයි නුඹට පුතේ 75
27. මේ දවස්වල 76
28. සුවදිනක් වේවි හෙට 77
29. කොරෝනාවට තිත තබමු 78
30. ඔන්ලයින් ඉස්කෝලේ 79
31. පාස්කු ඉරිදා 80
32. හීන්දෑරි කතක් 81
33. ඇඳිරි නීතියේ අපි 82
34. වෙසක් කූඩුව 82



35. කොරෝනා කාලේ සමරමු වෙසඟ 83
36. අහිමි වෙසඟේ අසිරිය 84
37. සිල් 84
38. වන්දේ වන්දේ තිලෝගුරු පියාණෝ 85
39. නොලැබුණු වෙසඟ 86
40. මුලාව 86
41. ස්වභාව ධර්මය ජීවිතේ 87
42. සසර බැමි දුරලමු 88
43. බලාපොරොත්තුව 89
44. අපූරු පාඩම 90
45. විස්සේ නිවාඩුව 91
46. මිහිමවගේ දඬුවම 92
47. නැවතුණු හීන 92
48. රොබරෝසියා පලස 93
49. මග බලන සිහින 94
50. ප්‍රතිපත්තියේ ගිලෙමු 94
51. අලුත් ටීචර් 95
52. ජපුර මව නිහඬයි 96
53. බාධක 97
54. නොදකින යථාර්ථය 97
55. විභාග 98
56. මැදින් ප්‍රේමයේ නිරිතදිග මෝසම් 99
57. දුර යන හීන 99
58. ජයවද්දනපුර වන්නම් 100

# වසංගතයේ අර්ථය සාහිත්‍යමය ඇසින්: ඇල්බෙයා කැමූගේ ''ද ප්ලේග්''නවකතාව ඇසුරින් නව කොරෝනා වසංගතය නැවත විමසා බැලීම

කථිකාචාර්ය චරිතා පබසරණි මාකස්

## 01. හැඳින්වීම

වසංගත රෝග ව්‍යාප්තිය පිළිබඳව පොත් පත්, ඉතිහාස කථා, සිනමාව හරහා පමණක් කියවූ සහ නැරඹූ තත්කාලීන සමාජයට එහි සැබෑ ස්වරූපය සැබැවින්ම අත්දකින්නට ලැබුණේ 2019 වසරේ අග භාගයේ පටන් ලොව පුරා පැතිර යන්නට වූ කොවිඩ් - 19[1] හෙවත් නව කොරෝනා වෛරස් ව්‍යාප්තියත් සමගය. නිශ්චිත ලෙසම මෙම වෛරසය මැඩපැවැත්වීමට හෝ සුව කිරීමට සමත් ප්‍රතිකාරයක් තවමත් නිපදවා නැති සමයක ලොව පුරා සෑම රටක්ම පාහේ මිනිසුන්ට තම දෛනික ජීවිතය ගෙවන්නට සිදුව ඇත්තේ කොරෝනා වෛරසයට බියෙනි. ලොව බලවත් රටවල් ලෙස සැලකූ රටවල් ද ඇතුළු කොට ගෙන සමස්තයක් ලෙස ලොව පුරා සියලු රටවල් ගණනාවක ආර්ථිකය, සමාජීය ජීවිතය අභියෝගයට ලක් කළ මෙම නව වෛරස් ව්‍යාප්තිය හේතුකොට ගෙන පුද්ගල ජීවන රටා විපර්යාසන්ට ලක් වූ අතර එහි අතුරු ප්‍රතිඵල ලෙස නව පුරුදු හුරු වීම, නව නිපැයුම් බිහි වීම, ඩිජිටල් තාක්ෂණය මත අධ්‍යාපනය, ව්‍යාපාර හා සෙසු ක්ෂේත්‍ර ගණනාවක් ක්‍රියාත්මක වීම

1. කොරෝනා වයිරස් රෝගය (COVID-19) යනු අලුතින් සොයාගත් කොරෝනා වයිරසයක් මගින් ඇතිවන බෝවන රෝගයකි.

සහ නව සාහිත්‍ය නිර්මාණ බිහිවීම විශේෂ කොට නිරීක්ෂණය කළ හැකි විය.

අනපේක්ෂිත ලෙස පැතිර ගිය නව කොරෝනා වෛරසයෙන් ආරක්ෂා වීමට, වසංගත බියෙන් දින ගණනක්, මාස ගණනක් සිය නිවසට වී හෝ නවාතැන්පළට වී සිර වී සිටි මිනිසා තමා තුළ ඇති වූ බිය, කාංසාව, මානසික අවපීඩනය ආදී තත්ත්වයන්ගෙන් මිදීම සඳහා තෝරා ගත් එක් මාර්ගයක් වන්නේ සාහිත්‍යයයි. මෙසේ වසංගතයේ අර්ථය, සාහිත්‍යමය ඇසින් දුටු මිනිසා වෛරස් බියෙන් උපන් සංකීර්ණ වූත් වියවුල් සහගත වූත් මිනිස් සිතුවිලි සාහිත්‍ය නිර්මාණ ලෙස එළිදැක්වූ අතර ඒ හරහා ලෝක සාහිත්‍යයේ තවත් එක් වසංගතයක් ආශ්‍රයෙන් සාහිත්‍ය නිර්මාණ ගණනාවක් ලොව පුරා බිහිවන්නට පටන් ගැනිණි.

වසංගත ආශ්‍රයෙන් බිහි වූ සාහිත්‍ය අද ඊයේ බිහි වූවක් නොවන අතර ලෝක සාහිත්‍ය ඉතිහාසය දෙස විපරම් කර බලන විට වසංගතවල අර්ථය සාහිත්‍යමය ඇසින් දකිමින් රචනා වූ සත්‍ය කථා මෙන්ම ප්‍රබන්ධ ද ගණනාවක් හඳුනාගත හැකිය. රෝග බියෙන් පීඩිතව, ජීවිත ආරක්ෂාව ප්‍රාර්ථනා කරමින් නිරෝධායනය වෙමින් සිටි ජනයා පාදක කර ගනිමින් සාහිත්‍යකරුවෝ තමා වසංගතය දුටු ආකාරය, ඉන් ජනයා පීඩා විඳි ආකාරය සහ සමස්තයක් ලෙස වසංගතයෙන් උගත් පාඩම් තම සාහිත්‍ය නිර්මාණවලට පාදක කර ගත්හ.

වසංගත ආශ්‍රිතව බිහි වූ සාහිත්‍ය නිර්මාණ අතර විශිෂ්ට සාහිත්‍ය කෘතියක් ලෙස සැලකෙන ප්‍රංශ දාර්ශනිකයකු මෙන්ම කතුවරයකු ද වූ ඇල්බෙයා කෙමූ විසින් 1947 දී රචිත (The Plague) ද 'ප්ලේග්' (ප්‍රංශ භාෂාවෙන් 'La Peste') නම් වූ නවකතාව ප්‍රංශ ඇල්ජීරියානු නගරයක් වන ඕරාන් නගරය අතුගා දැමූ බුබොනික නම් වසංගතයක් (Bubonic Plague)[2] පාදක කරගෙන රචනා වූවකි. 1940 දශකයේ මුල් භාගයේ පැතිර ගිය වසංගත තත්ත්වයක් නිසා සම්පූර්ණයෙන්ම අගුළු දමා වසා දැමූ ප්‍රංශ ඇල්ජීරියාවේ ඕරාන් නම් නගරයේ වැසියන් වසංගතයට ප්‍රතිචාර දක්වන ආකාරය මෙම නවකතාවට පාදක වෙයි. එදා සාහිත්‍යමය ඇසින් දුටු වසංගතය අද සැබැවින්ම ලෝක වැසියන් අත් විඳින්නේ කොවිඩ් - 19 වසංගතය පැතිර යාම හා ඉන් හටගත්තා වූ සමාජ විපර්යාසය ලෙසයි. අප අද මේ අත් විඳින්නේ නවකතාවෙහි එන ඕරාන් පදිංචිකරුවන් විසින් එදා අත් විඳින ලද යථාර්ථයයි. ඒ අනුව මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් බලාපොරොත්තු වන්නේ ඇල්බෙයා කෙමූගේ 'ද ප්ලේග්' නවකතාව ඇසුරින් තත්කාලීන නව කොරෝනා වසංගතය නැවත විමසා බලමින් එදා සාහිත්‍යකරුවා දුටු වසංගතයේ අර්ථය සැබෑ වසංගත සමයකට වැදගත් වන ආකාරය විමසා බැලීමයි.

2. යර්සීනියා පෙස්ටිස් (Yersinia Pestis) නම් බැක්ටීරියාව නිසා ඇති වන වසංගත වර්ග තුනෙන් එකකි බුබොනික් වසංගතය.



## 02. සාකච්ඡාව

### ප්‍රබන්ධය යථාර්ථයක් වීම

කොරෝනා වෛරසය වැනි ලොව පැතිර යන වසංගත තත්ත්වයක දී ඕනෑම රටක්, සමාජයක් ආර්ථිකමය වශයෙන් පසුබැසීම අනිවාර්යය සාධකයක් වන අතර ඒ හා සමගාමීව සමාජීය හා සංස්කෘතික තත්ත්වයන් ද අභියෝගයට ලක් වීම පොදුවේ අත්විඳිය හැකිය. නව කොරෝනා වෛරසය ලොව පුරා රටල් බහුතරයක පැතිර යාමත් සමග ලොව බලවත් රටවල් පවා ආර්ථිකමය වශයෙන්ද, සමාජීය වශයෙන්ද, සංස්කෘතිකමය වශයෙන්ද බරපතල අභියෝගවලට මුහුණ දෙමින් සිටියි. මෙම හදිසි විපර්යාසය හමුවේ ඇතිවන කම්පනයෙන් මිදීමට මිනිසා විසින් විවිධ ක්‍රමෝපායන් සොයා ගනු ලැබූ ආකාරය සමාජය දෙස විපරම් කරන විට හඳුනාගත හැකිය. සාහිත්‍යමය නිර්මාණ බිහි කිරීම මේ අතර කැපී පෙනෙන ලක්ෂණයක් ලෙස දැක්විය හැකි ය.

ඈත අතීතයේ පටන්ම මිනිසා විසින් තමා මුහුණ දෙන ලද දුක් කරදර, අභියෝග, ප්‍රශ්න හා ගැටලු සාහිත්‍ය නිර්මාණ ආශ්‍රයෙන් හෙළි කිරීමට පෙළඹී සිටියි. වසංගත ඉතිහාසය හා සාහිත්‍යය අතර ඇති සම්බන්ධය විමසා බලන කල මෙවන් වසංගත

අභියෝග හමුවේ මිනිසා ඊට මුහුණ දුන් ආකාරය, තම කම්පනය සාහිත්‍යය හරහා මුදා හැරි ආකාරය හඳුනාගත හැකිය. සාහිත්‍යය විශේෂයෙන්ම වසංගත පිළිබඳව ඉතා සමීප දැක්මක් ගෙනහැර පායි. මෙකී සාහිත්‍ය නිර්මාණ විමසා බැලීමේ දී වසංගත මිනිස් සංහතියට බලපෑ ආකාරය සමීපව හඳුනාගත හැකිය. එපමණක් නොව වසංගත සමය ආශ්‍රිතව බිහි වූ සාහිත්‍ය නිර්මාණ පිරික්සීමේදී එකී කාලවලදී පැවති සමාජ, සංස්කෘතික, ආර්ථික හා දේශපාලන පැතිකඩවලද වසංගතය හේතුකොට ගෙන සිදු වූ විපර්යාස පිළිබඳ වටහා ගැනීමට ද මෙම නිර්මාණ උපකාරී වේ. විශේෂයෙන්ම වසංගත සමය තුළ මිනිස් ක්‍රියාකාරකම් සහ මනුෂ්‍ය ජීවිතයේ සාරය සාහිත්‍යකරුවා විසින් ග්‍රහණය කර ගනු ලැබූ ආකාරය මෙම සාහිත්‍ය නිර්මාණ පිරික්සීමේ දී වටහා ගත හැකි ය.

ප්‍රංශ දාර්ශනිකයකු, කතුවරයෙකු වූ ඇල්බර්ට් කැමූ (1913-1960) විසින් 1947 වර්ෂයේ දී රචනා කරන ලද The Plague නම් නවකතාව ප්‍රංශ ඇල්ජීරියානු නගරයක් වන ඕරන් නගරය පුරා පැතිර ගිය Bubonic Plague නැමැති වසංගත උණ රෝගයක් නිසා එම නගරයේ සිදු වූ විපර්යාස පිළිබඳ පෙළ ගැස්මක් ඉදිරිපත් කරයි. වසංගතය නිසා හුදෙකලා වූ නගරයක ජීවන රිද්මය හෙළි කරන මෙම නවකතාව ඇල්බර්ට් කැමූ විසින් රචනා කරන ලද ග්‍රන්ථ අතර විශිෂ්ට සාහිත්‍ය නිර්මාණයක් ලෙස ප්‍රකටය. පැතිර යන වසංගතය හමුවේ ඕරන් නගරයෙහි සිදු වන සමාජීය, දේශපාලන, ආර්ථික හා ආගමික සන්දර්භය විස්තර කරන ඇල්බර්ට් කැමූ තවදුරටත් මෙම නවකතාව හරහා වසංගතය නිසා මිනිසාගේ මානසික සුවයට ඇතිවන බලපෑම හා එහි ප්‍රතිවිපාක ද තම දෘෂ්ටි කෝණයෙන් ඉදිරිපත් කරයි. වසංගත සමයක මිනිස් ඉරණම විසඳෙන ආකාරයත්, ආදරය හා යුතුකම් අභියෝගයට ලක් වන ආකාරයත්, ඒ සියල්ල හමුවේ මිනිසා තුළ ඇති දෙවියන් පිළිබඳ වූ විශ්වාසය යනාදී තේමාවන් පිළිබඳවත්, කැමූ මෙම නවකතාවෙන් විශේෂයෙන් අවධානයට පාත්‍ර කර ඇත.

වසංගත පිළිබඳ මින් පෙර අසා ඇති මුත් වර්තමානයේ අප මෙන්ම ඔරාන් වැසියන්ද එම තත්ත්වය උඩුදුවන තුරු මෙහි



ඇති සංකීර්ණ බව හඳුනාගත්තේ නැත. නවකතාවේ එන පරිදි වසංගතයේ මුල් සමයේ දී එය සාමාන්‍ය දෙයක් ලෙස සලකා බොහෝ දෙනා තම සුපුරුදු දින චර්යාවෙහි නිරත වූහ. නමුත් මරණ ගණන දිනෙන් දින වැඩි වන විට, ඉන් පසු එම ගණන දෙගුණ තෙගුණ වන විට වසංගතයේ සැබෑ තත්ත්වය ඔවුන්ට අවබෝධ වන්නට පටන් ගත්තේය.

"Moreover" the epidemic seemed to be on the wane; on some days only ten or so deaths were notified' Then, all of a sudden, the figure shot up again, vertically. On the day when the death-roll touched thirty, Dr. Rieux read an official telegram that the Prefect had just handed him, remarking; So they've got alarmed at last." The telegram ran; Proclaim a state of plague stop close the town." (Camus, 1947)

"එපමණක් නොව, වසංගතය අඩුවෙමින් පවතින බවක් පෙනෙන්නට තිබුණි; සමහර දිනවල මරණ දහයක් හෝ ඊට වැඩි ගණනක් වාර්තා විය. එවිට, හදිසියේම, රූපය නැවතත් සිරස් අතට හැරිණි. මරණ ගණන තිහට ළඟා වූ දිනයේදී, වෛද්‍ය රියුක්ස් ශිෂ්‍ය නායකයකු විසින් තමාට භාර දුන් නිල විදුලි පණිවුඩයක් කියවූ අතර එහි සඳහන් වූයේ, ඔවුන් අන්තිමේදී තැතිගෙන ඇත; නගරය ආසන්නයේ වසංගත තත්ත්වයක් ප්‍රකාශ කරන්න."

කොරෝනා වසංගත පැතිර යාම ආරම්භයත් සමගම එය සාමාන්‍ය දෙයක් ලෙස සලකා නිසි පියවර නොගත් බොහෝ රටවල් අවසානයේ වසංගතයේ ගොදුරු බවට පත් වූයේ ඉතා ශීඝ්‍ර ලෙස දිනපතා ඉහළ යන රෝගී සංඛ්‍යාවකින් සහ මරණ ගණනකින් යුක්තවයි. රටවල් ගණනාවක් වසා දමන තත්ත්වයට එන විට රෝගය එම සමාජයේ උඩුදුවා තිබුණි. එනිසාම ලොව බලවත්ම රට වන ඇමරිකාවට පවා මෙම වසංගතයෙන් බලවත් ලෙස පීඩා විඳීමට සිදුවිය.

නව කොරෝනා වෛරසය අපගේ දෛනික ජීවිතය හා සන්නිවේදනය බරපතල ලෙස උදුරාගෙන ගොස් ඇත. සෑම

දිනකම ඉහළ යන වෛරසය පිළිබඳව දත්ත සාමාන්‍ය ජීවිතය දුෂ්කරත්වයට හා ව්‍යාකූලත්වයට පත් කරයි. ඒ හා සමානව වෛරසයේ ආයු කාලය, වසංගතයේ උපකල්පිත කාලසීමාව, ආසාදන මාර්ග, ආරක්ෂිත පූර්වෝපායන්, ආහාර පුරුදු සහ අවශ්‍ය අගුළු දැමීමේ කාලය පිළිබඳව අසමාන පණිවිඩ බහුලව සංසරණය වන්නේය. (Banerjee D et al, 2020)

මේ ස්වභාවය කැමූ විසින් පෙර දකින ලද අතර එය නවකතාවේ විස්තර වන්නේ මෙපරිදිය.

“No longer were there individual destinies; only a collective destiny, made of plague and the emotions shared by all. Strongest of these emotions was the sense of exile and of deprivation, with all the crosscurrents of revolt and fear set up by these." (Camus, 1947)

"තවදුරටත් කිසිවෙකුටත් තනි ඉරණමක් නොතිබුණි; සියලු දෙනාටම අත් වූයේ වසංගතය විසින් තිළිණ කරන ලද සාමූහික ඉරණමක් සහ ඊට බද්ධ වූ හැඟීම් පමණි. මෙම චිත්තවේගයන්ගෙන් ප්‍රබලම දෙය නම් පිටුවහල් කිරීම සහ අහිමි වීමේ හැඟීමයි. මේ සියල්ල වසංගතයේ හරස්කඩය.”

කොරෝනා වසංගතය හමුවේ මිනිසා භේදයකින් තොරව පීඩාවට පත් විය. විවිධාකාර හේතු නිසා බෙදී සිටි ලෝකයේ මේ දෙපාර්ශ්වයටම අත්වූයේ එකම ඉරණමකි. සියල්ලෝම අහිමි වීමේ බියෙන් සහ සමාජ දූරස්ථභාවයේ කම්පනයෙන් පීඩාවට පත් වූහ. මරණයේ භීතිකාව සමස්ත ලෝකයම වෙළාගත් මේ අඳුරු සමයේ සියල්ලෝම තම ඉරණම කවරාකාරව විසඳේ දැයි පීඩනයකින් වෙළී සිටින්නෝය. කැමූ ගේ නවකතාවෙන් පිළිඹිබු කළ මේ යථාර්ථය වත්මන් මිනිස් වංශය අත්දකිමින් සිටින්නේය.

නවකතාවේ ආඛ්‍යානය සහ ප්‍රධාන චරිතය වන වෛද්‍ය රියුක්ස් බලධාරීන්ට වසංගතය පිළිබඳ මුලින්ම දැනුම් දුන් වෛද්‍යවරයෙකි. මානවවාදියෙක් වූ ඔහු තමාගේ අධික



තෙහෙට්ටුවද නොසලකා වසංගතයට එරෙහිව නිරන්තරයෙන් අරගල කරයි. තම බිරිඳගෙන් වෙන්ව සිටියා වූවද, වසංගතයට එරෙහි සටනෙන් තම අවධානය බැහැර නොකළ ඔහු තම පෞද්ගලික දුක් වේදනා නොසලකා වසංගතයට ගොදුරු වූවන් කෙරෙහි අනුකම්පාවෙන් කටයුතු කරයි.

“My question's this,' said Tarrou' “Why do you yourself show such devotion. considering you don't believe in God? I suspect your answer may help me to mine."

His face still in shadow, Rieux said that he'd already answered: that if he believed in an all-powerful God he would cease curing the sick and leave that to Him… in this respect Rieux believed himself to be on the right road (Camus, 1947)

"මගේ ප්‍රශ්නය මෙයයි," ටාරෝ පැවසීය. "ඔබ දෙවියන් වහන්සේව විශ්වාස නොකරන බව සලකමින් ඔබ එවැනි භක්තියක් පෙන්වන්නේ ඇයි? ඔබේ පිළිතුර මට උපකාරවත් වේ යැයි මම සැක කරමි. "

" ඔහු දැනටමත් පිළිතුරු දී ඇති බව රියුක්ස් පැවසීය: සර්වබලධාරී දෙවියෙකු විශ්වාස කළහොත් තමා රෝගීන් සුව කිරීම නවතා දමා එය දෙවියන්ට භාර දෙනු ඇත. මේ සම්බන්ධයෙන් රියුක්ස් විශ්වාස කළේ තමා නිවැරදි මාර්ගයේ යන බවයි.”

ඇල්බට් කැමූස්ගේ නවකතාව හරහා කොවිඩ් -19 වැනි වසංගතයක් ඇති වූ මෙවැනි කාලයක මිනිස් ආත්මයේ අගය කිරීම අපට මතක් කර දෙයි. නවකතාවේ එන කතා නායකයා වෛද්‍ය රියුක්ස්ගේ චරිතයෙන් විදහා දැක්වෙන වෘත්තීයභාවය හා විනීතභාවය රක්ෂා කරමින් වසංගතයෙන් පීඩාවට පත්වූවන්ට පිහිට වන පුද්ගලයන් වත්මන් තත්ත්වය හමුවේද දැකගත හැකිය.(Carlos, 2020)

පශ්චාද් යුද සමයේ හොඳම යුරෝපීය නවකතාව ලෙස බොහෝ දෙනා විසින් පිළිගන්නා ලද මෙම කැමූස්ගේ කතාවේ, වෛද්‍ය බර්නාඩ් රියූක්ස්, ඕරාන් වැසියන්ගේ වසංගත පීඩාව අවම

කිරීම සඳහා වෙහෙස මහන්සි වී වැඩ කරයි. එක් ඡේදයක ආචාර්ය රියුක්ස් මෙසේ පවසයි, "මේ කිසිවක් වීරත්වය ගැන නොවේ.. එය හාස්‍යජනක අදහසක් සේ පෙනෙන්ට පුළුවන්, නමුත් වසංගතයට එරෙහිව සටන් කිරීමට ඇති එකම මාර්ගය විනීතභාවයයි." වෛද්‍ය රියුක්ස් සඳහා, විනීතභාවය යන්නෙන් අදහස් කළේ සෞඛ්‍ය අර්බුදයේ දී මිනිසුන් විඳින දුක් වේදනා සමනය කිරීම සහ නිර්දය කළු මරණය හේතුවෙන් ඇති වූ මළ සිරුරු සංඛ්‍යාව ගොඩ ගැසීමයි. (Carlos, 2020)

නව කොරෝනා වසංගත භීතිකාව අතුරින් මනුෂ්‍යත්වයේ විශිෂ්ට ගුණය මතුකරමින් විශේෂයෙන්ම වෛද්‍යවරුන් සහ සුව සේවයේ නිරත කණ්ඩායම් වසංගතය හමුවේ කළ කැපකිරීම් පිළිබඳ ලොව නන් දෙසින් අසන්නට දකින්නට ලැබිණි. වසංගතය නිසා සිය සමීපතයන්ගෙන් ඈත්ව පීඩනයට පත් වූ මිනිස් සංහතිය සුවපත් කරන්නට ඇප කැප වූ ජීවක පරම්පරාවේ මෙම විශිෂ්ටයන් තම වෘත්තිය අකුරට ඉටු කරමින් මිනිස් ජීවිත බේරා ගැනීමට දැරූ සටන සුළු පටු නොවේ. එපමණක් නොව ආරක්ෂක හමුදා සහ වෙනත් අත්‍යවශ්‍ය සේවා සපයන වෘත්තිකයන් වසංගතය හමුවේ තම දිවි නොතකා පීඩනයට පත් ජනතාව හා ඔවුන්ගේ ජීවන තත්ත්වය යහපත්ව ගෙන යන්නට දරන උත්සාහය සෑම රටකම පාහේ කැපී පෙනෙන්ට විය. ඉහත කී වෘත්තිකයන් වෛරසය පාලනය කිරීමට හා ඊට ගොදුරුවූවන් සුවපත් කරන්නට දැරූ වෙහෙස අනභිභවනීය විය. මෙසේ සමාජ මෙහෙවරටම ජීවිතය කැප කරමින් වෛරසය වැළඳී මියගිය වෛද්‍යරුන් හා සුව සේවකයන් පිළිබඳ පුවත් ලොව සතර අතින් වාර්තා විය. මේ උත්සාහය හා කැපකිරීම් නවකතාවේ එන ප්‍රධාන චරිතය වන ආචාර්ය වෛද්‍ය රියුක්ස්ගේ චරිතය සිහිපත් කරවයි.

වසංගත රෝගයක් පැතිර යාමේ දී සමාජයේ එදිනෙදා හුරු පුරුදුවලට දැඩි ප්‍රතිවිරෝධයක් එල්ලවෙන අතර මිනිසාට තම දෛනික ජීවිතය පුරුදු ආකාරයට ගත කිරීමට නොහැකි වේ. වෛරසය කරණකොටගෙන නව පුරුදු හා චර්යා අනුගමනය කිරීමට මිනිසාට සිදුවෙයි. කොරෝනා වෛරසය හමුවේ ලොව පුරා



ජනතාවගේ දෛනික ජීවිතයට බාධා සිදු වූ අතර තම එදිනෙදා පුරුදුවලින් මිදී නව චර්යා රටාවලට හුරුවන්නට මිනිසාට සිදුවිය. සමාජ දූරස්ථභාවය ආරක්ෂා කිරීම, මුඛ ආවරණ පැළඳිම, නිවසේ සිට නිරෝධායනය වීම හෝ රාජකාරී කටයුතුවල නිරත වීම, නිතර අත් සේදීම හා විෂබීජ නාශක දියර භාවිතය වැනි නව පුරුදු සමාජගත වූවා පමණක් නොව බොහෝ දෙනා නිවසට වී කාලය ගත කරන්නට වීම නිසා දෛනික ජීවිතයේ සියලු ක්‍රියාවන්ගේ සහ චර්යාවන්ගේ රටාව විපර්යාසයකට ලක්විය. මෙම තත්ත්වය නව සාමාන්‍යකරණය (New Normal)[3] ලෙස හඳුන්වන්නට පටන් ගැනිණි. මෙසේ වසංගත පැතිරයාමක් හමුවේ මිනිස් හැසිරීම් විපර්යාසයකට ලක් වන ආකාරය පිළිබඳ කැමූ දුටුවේ මේ ආකාරයෙනි.

"habits tend to get lost initially and they start returning when the infection ceases" (Camus, 1947)

"පුරුදු මුලින් නැති වී යන අතර ආසාදනය නතර වූ විට ඔවුන් නැවත පැමිණීමට පටන් ගනී"

කැමූ සඳහන් කළ ආකාරයටම වසංගත බිය ක්‍රමයෙන් පහව යන විට පෙර වූ පුරුදු නැවත සමාජය වෙත පැමිණෙන ආකාරය සමාජය දෙස හොඳින් විමසීමේ දී නිරීක්ෂණය කළ හැකි ය. මෙහිදී අලුතෙන් හුරු වුණා වූ පුරුදු හා චර්යා රටාවන් මිනිසාගෙන් ගිලිහී නැවත සාමාන්‍යකරණයට පත් වීම දැකිය හැකිය. උදාහරණයක් ලෙස වෙනත් රටවල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ නව කොරෝනා වෛරසය මැඩ පැවැත්වීමත් සමග ජනතාව සිය දෛනික පුරුදුවලට නැවතත් හුරු වෙමින් සිටින අතර මුඛ ආවරණ පැළඳීම, සමාජ දූරස්ථභාවය ආරක්ෂා කිරීම වැනි නව පුරුදු ක්‍රමයෙන් ඔවුන්ගෙන් ගිලිහී යනු දැකිය හැකිය. නව සාමාන්‍යකරණය නැවත සාමාන්‍යකරණය වී ඇති බවක් මින් නිරීක්ෂණය කළ හැකිය.

3. නව සාමාන්‍ය තත්ත්වයක් යනු අර්බුදයකින් පසු සමාජයක ආර්ථිකමය සහ සමාජීය තත්ත්වය අර්බුදයේ ආරම්භයට පෙර පැවති තත්ත්වයට වඩා විපර්යාසයට ලක් වූ අවස්ථාවකි.

(Thompson, 1995) සඳහන් කරන ආකාරයට වසංගත කාලවලදී 'අවසානයට ඇති බිය' ඉතා පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි අතර ඒ මත පදනම් ව මිනිස් චර්යා විකාර රූපී වේ. පැවැත්ම පිළිබඳ දර්ශනවාදීන්ට (Existentialism)[4] අනුව මෙම විකාර රූපී බව හට ගන්නේ 'ජීවිතයේ අරුත සෙවීම' සහ 'විශ්වයේ පෙනෙන කිසිවක් නැතිය' යන එකිනෙකට ප්‍රතිවිරුද්ධ අදහස් ද්විත්වය අතර වන සට්ටනයේ ප්‍රතිඵලයක් ලෙසය.

අනපේක්ෂිත වූත්, පෙර සැලසුම් නොකළා වූත් නව කොරෝනා වෛරසය වැනි වසංගත තත්ත්වයක් හමුවේ මිනිසාගේ මානසික සුවයට ඇතිවන බලපෑම පිළිබඳව ද සාකච්ඡා කළ යුතුම වෙයි. සිය දෛනික පුරුදු හා ජීවන රටාවෙන් හදිසියේ මිදී, නිවෙස්වලට කොටු වී, සමාජ දූරස්ථභාවයෙන් කටයුතු කිරීම නිසා හුදකලාවට පත් වූ මිනිසා මුහුණ දෙන මානසික අභියෝග, වෛරසයේ අතුරු බලපෑමක් ලෙස හඳුනාගත යුතුය. සිය ආර්ථික තත්ත්වයන්ට ඇතිවූ බලපෑම, සමාජ විපර්යාස හා සංස්කෘතික අභියෝග හා විශේෂයෙන්ම ජීවන බිය හමුවේ ඇති වන මානසික වියවුල්භාවය ඉතා බරපතල මානසික තත්ත්වයන් බවට පරිවර්තනය වීම වැළැක්විය නොහැක.

වසංගත කාලවලදී ආතතිය සාමාන්‍ය දෙයකි. නමුත් වෛරසය පාලනය කිරීමේ උත්සාහයක් ලෙස බිලියන ගණනක් අගුළු දමා අවිනිශ්චිතතාවකින් හා හුදෙකලා බවකින් ගත කරන සමයක ලෝකයටම බලපාන්නා වූ 'සමූහ-හිස්ටීරියා' (Mass Hysteria)[5] තත්ත්වයක් පිළිබඳ නව කතිකාවතක් ඇරඹී ඇත. කොවිඩ් -19 හේතුකොට ගෙන ලොව පුරා 'විකාර රූපී කුණාටුවක්'

4. පැවැත්ම යනු දාර්ශනික න්‍යායක් වන අතර මිනිසුන් ඔවුන්ගේ තේරීම් සහ ක්‍රියාවන් පාලනය කරන නිදහස් නියෝජිතයන් වන බව ඉන් දක්වයි. පුද්ගල පැවැත්ම පිළිබඳ න්‍යාය මගින් අවධාරණය කරන පරිදි සමාජය පුද්ගලයෙකුගේ ජීවිතය හෝ ක්‍රියාවන් සීමා නොකළ යුතු බවත් මෙ නිදහ-සට සීමා පැනවීම නිසා එම පුද්ගලයාගේ හැකියාවන් වර්ධනය කිරීම වළක්වයි.
5. පුද්ගලයන් පිරිසකට සමූහ වශයෙන් බලපාන කාංසාව, අතාර්තික හැසිරීම් හෝ විශ්වාසයන් හෝ පැහැදිලි කළ නොහැකි රෝග ලක්ෂණ වලින් යුතු මානසික තත්වයක්.



ලෙස මෙම තත්ත්වය පැතිර ගොස් ඇත. දිනපතා වාර්තා වන සිද්ධීන් ගණන, මරණ සහ සුව වීම් පිළිබඳව පමණක් අවධානය යොමුව ඇති සමයක පුද්ගල 'මනෝසමාජීය ව්‍යුහය' බොහෝ දුරට නොසලකා හැර තිබේ. මන්දයත් එය සමාජයට සියුම්ව බලපාන හෙයින් සහ එය අපගේ ජීවන තත්ත්වය සහ සිතුවිලිවලටද ඉදිරියේ දී ගැඹුරින් බලපෑ හැකි බැවිනි. (Banerjee D et al, 2020)

කැමූ සිය නවකතාවෙහි මිනිසුන් විසින් මුහුණ දුන් මෙම විපර්යාසය දුටුවේ මේ ආකාරයෙනි.

At first the fact of being cut off from the outside world was accepted with a more or less good grace, much as people would have put up with any other temporary inconvenience that interfered with only a few of their habits. But, now they had abruptly become aware that they were undergoing a sort of incarceration under that blue dome of sky, already beginning to si'le in the fires of summer…

(Camus, 1947)

"මුලදී බාහිර ලෝකයෙන් කපා හැරීම මිනිසුන් විසින් අඩු වැඩි වශයෙන් පිළිගන්නා ලදි. මිනිස්සු ඔවුන්ගේ පුරුදුවලට බාධා කරන වෙනත් තාවකාලික අපහසුතාවන්ට මුහුණ දෙමින් සිටියහ. එහෙත්, මේ නිල් අහස යට යම් ආකාරයක සිරගත කිරීමකට ලක්ව සිටින බව දැන් ඔවුන් හදිසියේම වටහාගෙන ඇති අතර, ඒ වන විටත් ගිම්හානයේ ගින්නෙන් ගිලෙන්නට පටන් ගෙන තිබේ."

නවකතාවේ එන පරිදි වෛරසයේ ආරම්භය වන්නේ ඕරන් හි වීදිවල මීයන් සිය ගණනින් මියයෑමත් සමගය. පළමු මිනිස් සිද්ධීන් මතුවෙද්දී නගර වැසියන් තුළ වූයේ උදාසීනත්වයකි. මෙවැනි අසාමාන්‍ය යමක් වීමේ ඉඩක් නැති බව ඔවුහු සිතන්නට වූහ. මේ ආකාරයටම කොරෝනා වෛරසය ලොව ආරම්භ වූ මුල් කාලයේ දී බොහෝ රටවල ඒ හා සමාන උදාසීනතාවක් දක්වන ලදී. මෙතරම් ව්‍යසනයක් හෝ එය ගෝලීය ව්‍යසනයක් බවට පත් වේ යැයි කිසිවෙක් අපේක්ෂා නොකළහ. මේ උදාසීනත්වය හේතුකොට

ගෙන ලොව පුරා කොරෝනා වෛරසය ශීඝ්‍ර ලෙස පැතිර යන්නට පටන් ගැනිණි. කැමූගේ නවකතාවේ සඳහන් වසංගතය ආරම්භ වූයේද මීට සමාන ලෙසිනි.

"Our townsfolk realized that they had never dreamed it possible that our little town should be chosen out for such grotesque happenings as the wholesale death of rats in broad daylight or the decease of concierges through exotic maladies..." (Camus, 1947)

"ඒ කාලයේ මීයන් තොග වශයෙන් මරණයට පත් වීමේ දී අපේ නගර වැසියෝ කිසි විටෙකත් මෙවන් විපතක් වේ යැ'යි අපේක්ෂා නොකළහ."

මේ අනුව ප්‍රබන්ධයේ දිග හැරෙන කතාන්දරය අද වන විට යථාර්ථයක් බවට පත් වී ඇති සැටියක් මෙම කරුණු විමසීමේ දී නිගමනය කළ හැකිය. සාහිත්‍යකරුවකු විසින් වසර හැත්තෑවක්ටත් පෙර දකින ලද සිද්ධීන් අදටත් වලංගු වන්නේ වසංගතයක ඇති අවිනිශ්චිත බව සහ සංකීර්ණ බව නැවත නැවතත් ලෝකයාට සිහි ගන්වමිනි. එපමණක් නොව වසර ගණනාවක් පැරණි වුවද මෙවැනි සාහිත්‍ය කෘතියක ඇති කාලීන වැදගත්කම නොනැසී පවතින්නක් බව මින් අවධාරණය කළ හැකිය.

## කාලීන වැදගත්කම

කෙමූගේ 'ද ප්ලේග්' නවකතාවෙහි ඇති කාලීන වැදගත්කම මෙවන් සැබෑ වසංගත සමයක ඉවත දැමිය නොහැකිය. මේ නිසාම බොහෝ විද්වත්හු සහ ජනමාධ්‍යවේදීහු 'ද ප්ලේග්' නවකතාව ඇසුරින් නව කොරෝනා වෛරසයට මුහුණ දිය හැක්කේ කෙසේ ද යන්න විමර්ශනාත්මකව විශ්ලේෂණය කිරීම කාලීන වැදගත්කමක් ලෙස දකිමින් පර්යේෂණ පත්‍රිකා මෙන්ම පුවත්පත් ලිපි ගණනාවක්ම පළ කළහ.

The Week ප්‍රවෘත්ති සඟරාවේ පළ වූ Albert Camus in the time of Coronavirus ලිපියට අනුව ඇල්බෙයා කැමූගේ 'ද ප්ලේග්' නවකතාව මගින් වර්තමාන ගෝලීය වසංගතය වටහා ගැනීමට පළ කෙරෙන ඉඟි කාලීන වැදගත්කමක් ගනී. ඒ අතර පහත කරුණු ඉතා වැදගත් පාඩමක් වසංගතය ගැන අපට කියා දෙන්නේය.



- වසංගත ඉතිහාසය පිළිබඳ අනාවරණය කිරීම - කොන්ස්ටන්ටිනෝපල්හි ජස්ටිනියානු වසංගතය, කළු මරණය, ලන්ඩනයේ මහා වසංගතය, මිලාන් මහා වසංගතය සහ ඇතැන්ස් වසංගතය ආදී ලෝක ඉතිහාසයේ පැතිර ගිය මහා වසංගත පිළිබඳව නවකතාවෙන් හෙළිදරව් කරන අතර එවැනි වසංගත නැවත ඇති වීමේ හැකියාව ඉන් අවධාරණය කරයි.
- යථාර්ථය සහ පරිකල්පනය අතර වෙනස - මිනිස් පරිකල්පනයෙන් බැහැරව අපේක්ෂා නොකළ මෙවැනි විපත් යථාර්ථයක් විය හැකි බව කැමූ අපට කියා දෙයි.
- කාලයෙහි ඇති වැදගත්කම - අපගේ ජීවිත පිළිබඳව අනාවැකි කිව නොහැකි බැවින් ආදරය හා සතුට සඳහා කාලය සොයා ගැනීම ඉතා වැදගත්ය.

(R' John, 2020)

The NewYork Times පුවත්පතේ 'Camus on the Coronavirus' යන ශීර්ෂය යටතේ පළ වූ ලිපිය අවධාරණය කරන පරිදි ඇල්බෙයා කැමූගෙ 'ද ප්ලේග්' නවකතාව අපට කියාදෙන්නේ ජීවත්වීමේ දී මරණය ඕනෑම අවස්ථාවක දී බලාපොරොත්තු විය හැකි බවයි. ඉන් ගැලවීමක් කිසිවකුටත් අපේක්ෂා කළ නොහැකි ය. මෙම ලිපිය තවදුරටත් අවධාරණය කරන්නේ කැමූ යනු වසංගතයක පෙර ගමන දැන ගත් මායාකරුවකු නොව මිනිස් ස්වභාවය සැබැවින්ම හඳුනාගත්තකු බවයි. ජීවත් වීම එක්තරා ආකාරයක වියවුලක් ලෙස දකින කැමූ, මෙම විකාර ස්වභාවයෙන් අප කලකිරීමකට පත් වීම නොව මිනිස් හදවත් මෘදු බවට පත් කරගැනීමත්, විනිශ්චයෙන් තොර වීමත්, සතුටෙන් සහ

කෘතඥතාවෙන් ජීවත් වීම වැදගත් බවත් අපට කියා දෙයි. (Botton, 2020)

BBC වෙබ් අඩවියෙහි Lucy Ash නමැති ජනමාධ්‍යවේදීනිය 'කොරෝනා වෛරස යුගයේ දී කැමූගේ වසංගතයෙන් ඇල්ජීරියාව උගත් පාඩම්' (Algeriazs lessons farom the Plague in the age of Coronavirus) යන මැයෙන් පළ කරන ලද ලිපියෙහි සඳහන් වන ආකාරයට ඇල්ජීරියානු වෛද්‍ය මහාචාර්ය Salah Lelloul පවසන්නේ දිනෙන් දිනම වැඩි වන කොරෝනා රෝගීන් සංඛ්‍යාව හමුවේ තමා ද වෙහෙසට පත්ව ඇති බවයි. ඔහු වැඩිදුරටත් දක්වන්නේ කොරෝනා වෛරසය සහ කැමූගේ වසංගතය අතර සමාන්තර භාවයක් ඇති බවයි. අප්‍රිකා මහාද්වීපය තුළ තෙවැනි වැඩිම රෝගීන් ගණනක් වාර්තා වූ රට වන ඇල්ජීරියාව අද කැමූගේ නවකතාවේ යථාර්ථය අත්විඳිමින් සිටියි. එදා නවකතාවේ එන ඔරාන් නගරවාසීන් කලබලයට හා පීඩාවට පත් වූ ආකාරයටම තත්කාලීන ඇල්ජීරියානු වැසියන් කොරෝනා වෛරසය නිසා පීඩාවටත් නොසන්සුන් බවටත් පත්ව ඇති බව මහචාර්ය Salah Lelloul සිහි කරන්නේ කොරෝනා වෛරසය නිසා මියගිය අයෙකුගේ ඥාතියකු විසින් රෝහලේ අධ්‍යක්ෂකවරයකු ප්‍රාණ ඇපයට තබාගන්නා ලද නිසා ඔහු උඩුමහලකින් පනින්නට ගොස් තුවාල වූ සිදුවීමක් ද සිහිකරමිනි. ඉතා බරපතල තත්ත්වයෙන් දිනපතා රෝහලට ඇතුළු වන රෝගීන් මෙන්ම තම කාර්ය මණ්ඩලය ද කලබලයට පත් වන බවත්, මේ ගෙවෙන කාලය තම රටට ඉතාමත් අසීරු කාල සීමාවක් බවත් ඔහු දක්වයි. (Ash, 2020)

වෛද්‍ය රියුක්ස් පවසන පරිදි වසංගතය යනු වීරත්වය උලුප්පා දක්වන සමයක් නොව පොදු මානව දයාවකින්, විනීත බවකින් ගත කළ යුතු කාලයකි. වඩා වැදගත් වන්නේ මානවයා කෙරෙහි කරුණාව ඇති මිනිසකු බවට පත් වීමයි. මෙම වසංගතය ජය ගත හැකි එකම මාර්ගය වන්නේ ද එයයි.

“there is no question of heroism in all this. It is a matter of common decency……but the only means of fighting a plague is common decency." (Camus, 1947)



"මේ සියල්ල තුළ වීරත්වය පිළිබඳ ප්‍රශ්නයක් නොමැත. එය පොදු විනීතකමකි... නමුත් වසංගතයට එරෙහිව සටන් කිරීමේ එකම ක්‍රමය පොදු විනීතභාවයයි. "

“I feel more fellowship with the defeated than with saints. Heroism and sanctity don't really appeal to me, I imagine. What interests me is - being a man." (Camus, 1947)

"සාන්තුවරයන්ට වඩා මෙම රෝගයට නතුවූවන් සමඟ මට වැඩි සම්බන්ධයක් දැනෙනවා. වීරත්වය සහ පරිශුද්ධභාවයට මා ඇත්තෙන්ම කැමති නැහැ, මම සිතන විදියට, මට අවශ්‍ය මිනිසෙකු වීමයි.”

නවකතාව තුළ වෛරසය හමුවේ අභියෝගයට ලක් වූ සිය ප්‍රේමය පිළිබඳ වූ හැඟීම් යටපත් කර ව්‍යසනයෙන් තම නගරය බේරාගන්නට වෛද්‍ය රියුක්ස් කැප වී කටයුතු කළේය. ඛේදජනක වූ සමූහ ඉරණමක් කරා යන ගමනේ දී ප්‍රේමයේ වේදනාව යටපත් කරමින් මිනිසුන් සුවපත් කරන්නට අදිටන් කරගනී. සිය පෞද්ගලික අරමුණු ඉක්මවා සියලු සත්ත්වයන් කෙරෙහි ඇති කරගත් ප්‍රේමයකින් මෙම වෛද්‍යවරයා මානව දයාව පිළිබඳ වූ නව අර්ථකථනයක් ඉදිරිපත් කළේය.

“I understand," Paneloux said in a low voice. “That sort of thing is revolting because it passes our human understanding. But perhaps we should love what we cannot understand."

Rieux straightened up slowly…

“No, Father. I've a very different idea of love. And until my dying day I shall refuse to love a scheme of things in which children are put to torture." (Camus, 1947)

"මට තේරෙනවා," පැනෙලූක්ස් පහත් හඬින් පැවසීය. "මෙවැනි දෑ අපේ මිනිස් අවබෝධය ඉක්මවා යන ප්‍රතිවිරුද්ධ

අදහස්. නමුත් සමහරවිට අපට තේරුම්ගත නොහැකි දේට අප ආදරය කළ යුතුයි. ”

රියුක්ස් සෘජුව නැගී සිටිමින්,

“නෑ තාත්තේ. මට ආදරය පිළිබඳ ඇත්තේ වෙනස් අදහසක්. මා මිය යන දවස දක්වාම ළමයින්ට වදහිංසා පමුණුවන දේවල්වලට මම ආදරය නොකරමි.”

කැමූගේ නවකතාවේ වසංගතයෙන් ඉස්මතු වන මානව දයාවේ පාඩම අද මේ ගත වන කොරෝනා වසංගත සමටය ද වලංගුය. මන්ද සමූහ ඉරණමක් කරා යන මිනිස් පරම්පරාවකට තම වර්ගයාට මානව දයාව දැක්වීම හැර කළ හැකි විකල්පයක් නැත. වසංගතය ජය ගත හැකි එකම මාර්ගය නම් සියලු මිනිසුන් සාමූහිකව ඊට මුහුණ දීමයි.

## 03. සමාලෝචනය

කැමූ තම නවකතාවේ දක්වන පරිදි වසංගතයක් ඇතිව හෝ නැතිව වුවද, මිනිස් ජීවිතය යන්න හදිසි මරණයකට ගොදුරු වීමේ අවදානමකින් පවතින්නකි. එය අපගේ ජීවත් වීමේ අර්ථය ක්ෂණිකව බැහැර කරයි. මේ නිසා ඒ පිළිබඳව සිහිකොට, අවබෝධ කරගෙන ජීවත් වීමේ වැදගත්කම කැමූ දක්වන අතර මෙවන් වසංගත සමයක එහි අර්ථය වඩාත් පිළිබිඹු වන්නේය. තව ද කැමූගේ ප්‍රබන්ධය කියවීමෙන් මෙවැනි වසංගත හමුවේ මිනිසාගේ ස්වභාවය සහ ප්‍රජාවක් වශයෙන් අපගේ ප්‍රතිචාර කෙසේ විය යුතුද යන්න තවදුරටත් අනාවරණය කරයි. කැමූගේ නවකතාව අවසානයේ වඩා දිරිමත් සිතකින් වසංගතයට මුහුණ දුන් ඇත්තෝ වසංගතය පහව යන තුරු සිය දිවි ආරක්ෂා කරගෙන ජීවත් වීමට වාසනාව ලබති. එසේම භයානක වසංගතයකින් පීඩා විඳින වත්මන් සමාජයට ද සිය චිත්ත ශක්තිය වැඩි දියුණු කරගෙන වසංගතයට මුහුණ දෙනවා මිස ඉන් පළා යාමට හැකියාවක් නැති බව ඉන් නැවත නැවතත් සිහි කරයි. වසංගතයට භේදයක් නොමැති අතර



මිනිසුන් වර්ණ, ආගම්, ජාති ආදී නොයෙක් ලෙස බෙදී සිටිය ද මේ සියල්ලටම වසංගතය හමුවේ හිමිවන්නේ එකම ඉරණමක් පමණි. අප කැමැත්ත ඇතිව හෝ නැතිව මේ ඉරණමට මුහුණ දීමට අපට සිදුව ඇත. එහිදී තනි තනිව මේ දුක් පීඩා විඳිනවාට වඩා සමූහයක් ලෙස ඒකරාශි වෙමින් මෙම වසංගතය ජය ගැනීමට උත්සාහ කිරීම කළ යුතු බව කැමූ තම නවකතාවෙන් අවධාරණය කරයි. දුක සහ වේදනා අපට උරුමයෙන් පැමිණෙන අතර අපටද පාලනය කළ නොහැකි බලවේගයක අපි ප්‍රාණ ඇපකරුවන් වී සිටිමු. මෙවැනි සමයක වඩා වැදගත් වන්නේ අප අපගේ අවට සිටින අනෙකුත් මනුෂ්‍යයන් කෙරෙහි අපගේ වගකීම් ඉටු කිරීම බව නවකතාව අපට සිහි ගන්වයි. එපමණක් නොව මේ දුක සහ වේදනාවට නිමක් නැත. මෙවැනි වසංගත නැවත පැමිණිය හැකි ය. කැමූ තම නවකතාවෙන් දුන් පණිවිඩය එයයි. අද අපි යථාර්ථය අත් දකිමු. ඒ අනුව කොවිඩ් වසංගතය හමුවේ මිනිසා ගේ වර්තමාන ඉරණම අභියෝගයට ලක් වී ඇති සමයක ඇල්බර්ට් කැමූගේ මෙම නවකතාව වර්තමානය කියවීමක් ලෙස හැඳින්විය හැකි ය. වසංගතය හමුවේ සමාජ දූරස්ථභාවයට පත් වූ සහ නිරෝධායනයට පත් වූ මිනිසුන්ගේ කම්පනය හෙළි කර ‘ද ප්ලේග්’ නවකතාව වසංගතය බිලිගත් නගරයක දුක්ඛිත රූපය පාඨකයාට චිත්‍රණය කරයි. මිනිස් මනෝභාව පිළිබඳව හෙළි කරන මෙම නවකතාව වත්මන් සමාජ යථාර්ථයට වඩා සමීප බව හඳුනාගත හැකි ය. අවසාන වශයෙන් කැමූ තම නවකතාවෙන් වර්තමාන කොවිඩ් උවදුරට ගොදුරු වූ සමාජයට අර්ථ ගන්වන්නේ ප්‍රජාවක් ලෙස එකිනෙකාට සහයෝගය දක්වමින් ජීවත් වීමේ වැදගත්කමයි. අවධානයට මුහුණ දිය යුත්තේ තනි තනිව නොව සමූහයක් වශයෙනි. එවිට මෙවැනි වසංගත හමුවේ නොසැලී සිටින්නට අපට ශක්තිය ලැබෙනු ඇත.

## මූලාශ්‍රය


1. Ash, L., 2020. Algeria's Lessons From The Plague In The Age Of Coronavirus. [online] BBC News. Available at: https://www.bbc.com/news/world-africa-53946103 [Accessed 18 September 2020].
2. Banerjee D, Rao TSS, Kallivayalil RA, Javed A. Revisiting 'The Plague' by Camus: Shaping the 'social absurdity' of the COVID-19 Pandemic. Asian Journal of Psychiatry. 2020
3. Botton, A., 2020. Camus on the Coronavirus. The NewYork Times, [online] Available at: https://www.nytimes.com/2020/03/19/opinion/sunday/coronavirus-camus-plague.html [Accessed 15 September 2020].
4. Camus A. Vintage; New York: 1947. La Peste (The Plague)
5. Carlos Franco-Paredes, Albert Camus' The Plague Revisited for COVID-19, Clinical Infectious Diseases, Volume 71, Issue 15, 1 August 2020, Pp. 898–899
6. Illing, S., 2020. This Is A Time For Solidarity. [online] Vox. Available at: https://www.vox.com/2020/3/13/21172237/coronavirus-covid-19-albert-camus-the-plague [Accessed 18 September 2020].
7. LitCharts. 2020. The Plague Quotes | Explanations With Page Numbers | Litcharts. [online] Available at: https://www.litcharts.com/lit/the-plague/quotes [Accessed 12 September 2020].
8. N. Thompson, The ontology of disaster, Death Stud., 19 (5) (1995), pp. 501-510
9. R. John, M., 2020. Albert Camus in the time of coronavirus. The Week, [online] Available at:https://www.theweek.in/leisure/society/2020/04/17/albert-camus-in-the-time-of-coronavirus.html [Accessed 15 September 2020].
10. Shimp, T., 2010. Advertising, Promotion, And Other Aspects Of Integrated Mrketing Communication. 8th ed. South Western Cengage Learning, p.282.




# 'දිසි විදැසි' කවිකම් - කාව්‍ය සංකල්පනා විමසුම

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ

## ප්‍රවේශය

කොවිඩ්-19 හෙවත් කොරෝනා වෛරස් රෝගය නිසා රටේ ඇති වූ හදිසි වාතාවරණය හේතුවෙන් සියලු ම විශ්වවිද්‍යාල ද වසා දැමීමට තීරණය කෙරිණි. එකී කාලය, නිවසේ රැඳී හුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සිසු සිසුවියන්ගේ නිර්මාණශීලි කුශලතාව ඔප් නැංවීම සඳහා යොදා ගැනීම, අප පීඨයේ පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද මහතාගේ අදහස විය. 'දිසි විදැසි' නමින් මෙසේ ප්‍රකාශයට පත්වන්නේ කොරෝනා වසංගත සමයේ එසේ ඊ සාහිත්‍යයක් (E-Literature) ලෙස ගොඩ නැගුණු අප පීඨයේ සිසු සිසුවියන්ගේ නිර්මාණශීලී කාව්‍ය වෑයම යි.

'දිසිවිදැසි' හි තේමාව වූයේ ද කොරෝනා සමයේ පැවති අසීරු වාතාවරණය යි. එය 2020 අප්‍රේල් 02 වැනිදායින් ඇරඹුණු අතර 2020 මැයි මාසයේ 31 වැනිදායින් අවසන් විය. ඒ අනුව දින 58ක් එනම් මාස දෙකක් පුරා අඛණ්ඩව මෙකී 'දිසිවිදැසි' නිර්මාණ පිටුව මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ ෆේස්බුක් පිටුවේ සහ පීඨ වෙබ් අඩවියේ ක්‍රියාත්මක විය. අප වෙත ලැබුණු නිර්මාණ අතුරින් ප්‍රශස්ත නිර්මාණ පමණක් තෝරා ගනු ලැබිණ. මෙහිලා අපගේ වෑයම වූයේ පැවති වසංගත තත්ත්වය හමුවේ නිවසට සීමා වූ

අප පීඨයේ දරු දැරියන්ට කිසියම් මානසික සහනයක් ලබාදීමට සහ ඔවුන්ගේ නිර්මාණ කුශලතා ඔප් නැංවීම ය.

**සාකච්ඡාව**

අප වෙත කවි එවූ දරුදැරියන් අතර පළමු වසරේ සිට අවසන් වසර දක්වා සියලුම වසර සහ සියලුම අධ්‍යයනාංශ නියෝජනය කරන දරු දැරියෝ වූහ. කොවිඩ් -19 වෛරස් රෝගය හේතුවෙන් විශ්වවිද්‍යාල වසා දමන්නේ, පළමු වසර සඳහා නවක සිසුන් විශ්වවිද්‍යාලයට පැමිණි දිනයේ දී ය. අවසන් වසරේ සිසු සිසුවියන්ගේ විභාග කටයුතු නිමාවෙමින් පවතින විට දී ය. ඒ අනුව අධ්‍යයන කටයුතු හමාර කළ අවසන් වසරේ සිසු සිසුවියන් පිරිසක් සහ අභිනවයෙන් විශ්වවිද්‍යාලයට පැමිණි, එහෙත් විශ්වවිද්‍යාල ජීවිතය අත්විඳින්නට නො හැකි වූ ප්‍රථම වසරේ සිසු සිසුවියන් පිරිසක් ද වූහ. දිසිවිදැසි කවිකම්වල මේ සියලු දෙනා අත්විඳි මානසික සංතාප, අපේක්ෂා භංගත්වය ද  සමාජ කියවීම් සහ සමාජ සංවේදිබව ද දැකිය හැකි විය.

පොළොන්නරුවේ සිට විශ්වවිද්‍යාලයට පැමිණි පළමු වසරේ කේ. පී. එන්. ප්‍රේමරත්නගේ 'බලා ඉන්නම් අම්මේ' කවි පන්තියට අරමුණු වන්නේ එක් දිනකට පමණක් සීමා වූ විශ්වවිද්‍යාල අත්දැකීම යි.

බලාපොරොත්තු දෑස් අග දල්වා
කොළඹ අහස යටට ඇවිදින්
රොබරෝසියා මල් සුවඳ විඳින තුරා - බලා ඉන්නම් අම්මේ...
රජරට කර්කශ පොළෝ තළයට
ඔට්ටු වන දෑතට සවියක් වන්නට සිහින මවමින්
හීනයක් නොවී පරිස්සමින් ඉන්න
දිනයක උණුසුම විඳි දරුවෙකි මා...

විශ්වවිද්‍යාලය ගැන දහසකුත් එකක් ප්‍රාර්ථනා පොදි බැඳ පොළොන්නරුව වැනි ඈත පෙදෙසකින් පැමිණ, රොබරෝසියා මලින් අලංකෘත වූ ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ දී ලැබූ එක් දිනක



අත්දැකීම මේ කවියට අනුභූතිය වී ඇත. උඟරගස්මංහන්දිය සිට විශ්වවිද්‍යාලයට පැමිණි පළමු වසරේ සිසුවකු වූ කේ. සඳුන් බුද්ධික ද සිල්වාට පාදක වන්නේ ද යට දැක්වූ අත්දැකීම ම ය. 'රොබරෝසියා පලස' නම් වූ කවි පන්තියෙන් සඳුන් දක්වා ඇත්තේ ද ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පැමිණීමෙන් ලද ආනන්දය යි.

ගෙනා මුත් පොදි බැඳන් සිනිඳු මුදු සිහින මලු
ලිහා දිගහරින්නට නොහැකි වී ගිය නමුත්
ලියමි අදටත් නුඹේ නමට සෝ ගී තැවුල්

විජේරාමෙන් හැරී නුඹ සිටින මං ඉමේ
රොබරෝසියා පලස පිනවුයේ නෙත නොවේ
නිදා සිටි හදවතයි

නිට්ටඹුවේ සිට සරසවියේ පළමු වසරට පැමිණි නෙරංජලා සංජීවනීගේ සංතාපයට හේතු වී ඇත්තේ ද එක් දිනක මතකයට හේතු වූ සරසවි අත්දැකීමයි. ඇය 'මග බලන සිහින' කවි පන්තියෙන් මතු කරන්නේ ඇගේ හිත රිදවූ ඒ හැඟීම යි.

කලු ලෝගුවට පෙම් බැඳි දා සිට
සිහිනයක් විය සරසවි මතක
පොදි බැඳන් ආ ජපුර බිම වෙත
සිහින කද මලු ගොන්න
මිරිඟුවක් වුණාදෝ ඒ රොබරෝසියා අරණ
කද මලු ලිහා ගැනීමටත් පෙරම - තවම මග බලයි සිහින

මෙම වසංගත තත්ත්වය මැඩ පැවත්වීම සඳහා අවශ්‍ය උපකරණ, සරසවි සිසුන්ගේ අලුත් නිමැවුම් ලෙස බිහිවුණු ආකාරය කලුතර, චාපා නිපුණි වාසනාගේ 'රකිමි මව්බිම' කවි පන්තියට පාදක වී ඇත. නිපුණි පළමු වසරේ සිසුවියකි. ඇය පවසන්නේ සමාජය වපරැසින් බැලූවද සරසවි සිසුන් සිය කාලය කැපකරමින් අරගල කරනුයේ අනාගතයේ මේ බිමට පැමිණෙන තමා වැනි වූ සොයුරු සොයුරියන් වෙනුවෙන් නිදහස් අධ්‍යාපනය සුරක්ෂිත කිරීමේ උදාර අරමුණෙන් බව ය. එකී දුෂ්කර අවස්ථා පවා සම

සිතින් දරාගන්නා දෙමාපියන් ගැන ඇය මෙහි දී සිහිපත් කර ඇත.

සරසවි බිමට පියමැන - මා ලද සරසවි වරම
අනාගත සොයුරන්ට - සුරැකිව ලැබුමට - අරගල කරන විට මා
නෙතේ කඳුළක් උනනු දුටුවා - අඳුරු වූ ඔබේ මුවින්

මානවවිද්‍යා අධ්‍යයනාංශයේ සිවුවැනි වසරේ ඉගෙනුම ලබන එම්. ඩී. භාග්‍යා විහාරා සෙව්වන්දි 'ජයවද්දනපුර වන්නම්' කවි පන්තියෙන් ද පළ කර ඇත්තේ සරසවියෙන් ඈත් වී සිටීමේ වේදනාව යි. එකී වේදනාව ඇය ඉස්මතු කර ඇත්තේ ජයවර්ධනපුරය නම් මවට සිය දරුවන් නොමැති ව තනිකමක් නැති ද යනුවෙන් ප්‍රශ්න කරමිනි. භාග්‍යා සිය කවිය විකාශනය කර ඇත්තේ කෝට්ටේ සමයේ ප්‍රචලිත වූ සන්දේශවල අන්තර්ගත ජයවද්දනපුර වැනුම සිහිගන්වන ආකාරයෙනි. මේ වනාහි සම්භාව්‍ය සාහිත්‍යයෙන් කිවිඳිය ලද ආභාසය පෙන්නුම කළ අවස්ථාවකි.

කුලවද්දන දරු කැළ දුරු රට යාද
හිරුවද්දන සූරිය මල් නොපිපුණිද
සිරිවද්දන බෝ මුල කිසිවකු නැද්ද
ජයවද්දන මව්, තනිකම දැනුණා ද

සරසවියේ අවසන් වසරේ ඉගෙනුම ලබන ඇය මෙන් ම තවත් බොහෝ දරු දැරියන්ට ද විශ්වවිද්‍යාලයේ ඇසුරෙන් ඈත් ව සිටීමට සිදුවීම තදින් දැනී ඇති බව පෙනේ. දේශපාලනවිද්‍යා අධ්‍යයනාංශයේ අවසන් වසරේ ඉගෙනුම ලබන එම්. සචිනි ලක්ෂිකා ද සිය 'දුර යන හීන' කවි පන්තියෙන් ප්‍රකාශ කර ඇත්තේ එකී හැඟීම යි.

කොරෝනා නුඹ ආවා වසංගතයක් නමින්
අපේ හීන බොඳ කරන්..
දවසින් දවස මේ ගෙවී යන්නේ
ජ'පුර අහසේ ගෙවන්නට තිබූ ලස්සන දවස්..



දිනෙන් දින අපේ හීන දුර යනෙන හින්දා
දරා ගන්නට බෑ තවත් මේ දුක් සුසුම් කඳුළු ගංගා
දැන්වත් ඇති කොරෝනා නැවතියන් නුඹ සදහටම
රන් ලෝගුවෙන් හැඩ වෙන දිනය ළං කරමිනා..

ඇයගේ සන්තාපයට හේතු වී ඇත්තේ කොරෝනා නිසා ඔවුන් උපාධියෙන් අභිෂේක වන දිනය තව තවත් ඈතට යාමේ කරුණ යි.

ශ්‍රී ලාංකිකයන් අත්‍යුදාරත්වයෙන් සැමරූ වෙසක් මංගල්‍යය එළඹුණේ ද මේ කාල වකවානුවේ දී ම ය. බෙන්තොට සිට පැමිණි තරිඳු ලසන්ත සිසුවාගේ 'ප්‍රතිපත්තියේ ගිලෙමු' කවි පන්තියට ප්‍රස්තුත වී ඇත්තේ එය යි.

පන්සලෙ සණ්ටාරෙ හඬ නොමැත වා තලයෙ
සුදු වතින් සැරි දනන් මහ මගේ  කළුනික ය.

විසල් තොරණින් නැගුණු හන්දියේ උජාරුව
දන්සැලක් පෝලිමක් මීටරෙන් වත් නොමැත

ගෙන්ගෙට ගලා යන සිල් සුවඳ අඩු නොමැත
නිරෝධානය වෙමින සැරසුවයි පිළිවෙතින

මේ වෙසගේ සිදු වූ වෙනස අත්දකින ඔහු නිරෝධායනය වෙමින් සිල් සමාදන් වන උවැසි උවැසියන්ගෙන් වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම පිළිවෙතින් පෙළ ගැසෙන ආකාරය සිය කවි පන්තියෙන් දක්වා ඇත.

වෙසක්  මංගල්‍යය නිමිති කොට ගෙන කවි රචනා කළ බොහෝ සිසුන් ඉගෙනුම ලබන්නේ දෙවැනි වසරේ ය. ඔවුන් අතරින් බහුතරයකට විශේෂ උපාධිය සඳහා තේරී පත්වීමට අවකාශ හිමි නො වූයේ ඊට ප්‍රථම විශ්වවිද්‍යාලය වසා දැමීම නිසා ය. නිකවැරටියෙන් පැමිණි හෂාන් කේ. විජේනායක විසින් රචිත 'වෙසක් කූඩුව', තංගල්ලේ ජේ. පී. ඉෂානි ලියූ 'වන්දේ වන්දේ

තිලෝගුරු පියාණෝ', මහ ඉඳුරුව, පැතුම් හෙට්ටිආරච්චි විසින් රචිත 'සිල්', බදුල්ලේ වී. එම්. පී. හෂානි ලියූ 'කොරෝනා කාලේ සමරමු වෙසඟ', මතුගම සෂිනි ගුරුසිංහගේ 'සසර බැමි බිඳලමු' ආදී කවි පන්තීන් ද දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ තෙවැනි වසරේ ඕ. කේ. ඩී. ඉසුරි වාසනාගේ 'අහිමි වෙසගේ අසිරිය', පළමු වසරේ එච්. නෙත්මි සාරදා ලියූ 'නොලැබුණු වෙසඟ', ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශයේ දෙවැනි වසරේ හිරුණි අමංගා දිසානායකගේ 'මුලාව' හා පළමු වසරේ ඕ. වී. පී. කවින්දි ලියූ 'ස්වභාවධර්මය ජීවිතේ' යනාදි කවි පන්තීන් සඳහා පාදක වී ඇත්තේ බුදුන්වහන්සේත්, කොරෝනා සමය හේතුවෙන් අහිමි වූ වෙසක් සමයත් ඒ ආශ්‍රිත සිදුවීම් ආදියත් ය.

2019 වසරේ මෙරට හීතියෙන් කම්පා කළ පාස්කු ප්‍රහාරය සිදු වී වසරක් ගත වන්නේ ද මේ වසංගත සමයේ දී ම ය. භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශයේ සිවුවැනි වසරේ ඉමල්ෂා නවරත්න සිසුවියගේ 'පාස්කු ඉරිදා' කාව්‍ය පන්තියෙන් අවධානය යොමු කර ඇත්තේ ඒ පිළිබඳව යි.

පාස්කු ඉරු දින - ගොළු කළ හදවත් අද දින
අවි නොදරාගත් අදුසුමන් ත්‍රස්තයෙක්
කළේ දෙව්මැදුරු හිස් වුණ
දෙවියන් වහන්සේ කළ පරීක්ෂාවක් දැයි නොදනිමි

එදා ඔබවහන්සේ එම දින - මානව සංහතියේ ගැලවුම පිණිස
කුරුස මත තැබූ දෙව් සිරුර - කියාදුනි දයාවේ පාඩම

ලොව සෑම ආගමක ම ගැබ් ව ඇත්තේ මනුෂ්‍යත්වයේ දහම යි. ඉමල්ෂා මෙහි දී ද ඉස්මතු කොට දක්වා ඇත්තේ ජේසුස්වහන්සේ විසින් මිනිසුන් වෙනුවෙන් කරන ලද කැපවීම යි. විශේෂයෙන් මෙබඳු වසංගත කාලවලදී එබඳු කැපවීම්වල ඇති අවශ්‍යතාව යි.

තව ද සිසු සිසුවියන් නොමැති ව හුදකලා වූ විශ්වවිද්‍යාලය බොහෝ අයට නිමිති වී තිබිණ. දෙවැනි වසරේ අචිනි



ලියනාරච්චි ලියූ 'ජපුර මව නිහඬයි', දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශයේ තෙවැනි වසරේ ඩබ්. ඒ. බී. එම්. විජේරත්න විසින් ලියන ලද 'රොබරෝසියා නුඹ', දෙවැනි වසරේ එම්. ඒ. ඩී. ප්‍රියදර්ශනීගේ 'බලාපොරොත්තුව', අපරාධවිද්‍යා හා අපරාධ යුක්තිය අධ්‍යයනාංශයේ තෙවැනි වසරේ ඉගෙනුම ලබන බී. එම්. ආශිංසනා බණ්ඩාරනායකගේ 'නැවතුණු හීන', නාත්තන්ඩියේ සිට පැමිණි තෙවන වසරේ ඉගෙනුම ලබන හංසි එස්. ප්‍රනාන්දු විසින් රචිත 'තනිකළා නෙවෙයි අම්මේ' එබඳු කවි පන්තීන් ය.

හංසි සිය කවියෙන් විශ්වවිද්‍යාලයත් ශිෂ්‍ය ප්‍රජාවත් අතර වන අත්‍යන්ත බැඳීම ඉස්මතු කරන්නී ය.

ආදරේ උල්පතයි ජපුර අම්මේ නුඹත්
නැහැවුණේ අප නැගෙන පෙණකැටි ලෙසත්
කුණාටුව හමාවිත් දුරට අප ඇදුනමුත්
රැඳුණෙ නුඹෙ තුරුලෙමයි එදා මෙන් අද හෙටත්

කුසයෙ නුඹෙ අරක්ගත් දරු කැලට වූ විපත
දරා මල් වගුරවයි සනසවන්නට දෙනෙත
දස අතම හමා යයි කොරෝනා වසංගත
අම්මෙ නුඹ ඉවසන්න කියන මේ දුක් පුවත

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ අවසන් වසරේ ඉගෙනුම ලබන මීනු ගුණසිංහ සිය 'ජපුර අම්මාට ලියනවග නම්' කාව්‍ය පන්තියෙන් දේව භක්තිය ප්‍රශ්නාර්ථයට ලක්කර ඇත්තේ විද්‍යාවේ සහ අධ්‍යාපනයේ වැදගත්කම හුවා දක්වමිනි. එසේ වුවද සොබාදහමට ආදරය කිරීමේ වැදගත්කම ද ඇය සිය කවියෙන් ඉස්මතු කොට දක්වන්නී ය.

අයුක්තිය සිදුවුණේ සොබාදම් මෑණියට
කෝ අම්මෙ දෙවිවරුන් වැන්ද අපි පෝළිමට
ඉගෙනුමට සෙවණ දුන් ඔබ පමණි සේවයට
දැයට වැඩ ඇති දූපුතුන් දුන්නේ බිමට

භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශයේ තෙවැනි වසරේ සිසුවියක වන ඩබ්. ඩබ්. ඒ. සී. සන්දීපාගේ 'නොකියාම ආපු ඔයාට' කාව්‍ය පන්තියට පාදක වී ඇත්තේ ද විශ්වවිද්‍යාලය වසා දැමීම යි. නර්තන විශේෂවේදී සිසුවියක වන ඇය, සිය සංතාපය කවියේ පද අතරට මුසු කර ඇත්තේ මෙසේ ය.

විසි එකේ බෙර හඬට - පද සුරල් පාගන්න
කොට්ටම්බ හෙවණ යට - තවත් දොඩමළු වෙන්න
නිදිගත්ත හීනයෙන් - අපට යළි ඇහැරෙන්න
කොරෝනා ඉක්මනින් - අප දමා ඔබ යන්න

පැවති අසීරු තත්ත්වය හමුවේ වෛද්‍යවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය ගන්නා වෙහෙස අගය කිරීමට ද මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ සිසු සිසුවියෝ අමතක නො කළහ. සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේද අධ්‍යයනාංශයේ තෙවන වසරේ ඉගෙනුම ලබන කවිඳු සුභාෂ් සිය 'වෙදැදුරනි පින් බෝම' කවි පන්තියෙන් කෘතඥතා පූර්වක ව සිහිපත් කර ඇත්තේ එකී සේවාව යි.

සැඩ කොරෝනා මැදින් - දිවි සයුර තරණයට
හබලක් ව නුඹ පැමිණ - සවිය විය දිරි ගන්ට

අනුන් හිත සුව පතා - නොගෙන කිසි ඉසිඹුවක්
වගුළ හැම දා බිඳම - මුතු කැටය, කරුණාවේ

කවිඳු, මේ අසීරු අවස්ථාවේ කිසිදු විවේකයක් නොලබමින් රෝගීන් සුවපත් කිරීමට වෛද්‍යවරුන් ගන්නා වෙහෙස, හෙළන දහදිය ඇගයීමට ලක් කර ඇත. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ දෙවැනි වසරේ ඉගෙනුම ලබන බුද්ධිකා පියුමාලි ද 'ජීවක මහිම' නම් සිය කවියට ප්‍රස්තුත කරගෙන ඇත්තේ කවිඳුට පාදක වූ අනුභූතිය ම ය. ඇය එහි දී සිය ගෞරවාදරය වෙදැදුරන් පමණක් නො ව හමුදා නිලධාරීන්ට ද පුදකර ඇත. ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ



තෙවැනි වසරේ සිසුවියක වන වී. ජී. තිළිණි ප්‍රබෝධා ද 'කොවිඩ් වසංගතය' යන හිසින් රචිත කවි පන්තියෙන් සිය කෘතවේදීත්වය වෙද, හෙද, පොලිස් සහ හමුදා නිලධාරීන්ට පුදකර ඇත.

සමස්ත ලෝකයම රෝගාතුර කළ කොවිඩ් - 19 වෛරස් රෝගය නිසා හීන වන ධෛර්යය නැවත වර්ධනය කිරීමේ අරමුණ, දෙවැනි වසරේ ඉගෙනුම ලබන රත්නපුරේ, එල්. රූපසිංහගේ 'බාධක' කවි පන්තියෙන් ඉස්මතු වේ. මේ කවි පන්තිය මාත්‍රා 10න් පසු ගුරක් යොදමින් යතිය පාදාන්තයේ පිහිටුවන උතු ඡන්දසට අයත් සුරමත්වැල විරිතෙහි ස්වරූපය දක්වයි.

වසංගත ලෙඩ රාශියක් - කරයි ලොව තුළ සක්මනක්
ලොවම බියපත් කළ ලෙසක් - දුබල වී ඇත ලොව අඩක්

දිනාගන්නට මහ මෙරක් - පැතුම් ඇත සිත කප්පරක්
පසුතැවෙන්නට නෑ ඉඩක් - නැගිට ජය ගමු නව ලොවක්

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ තෙවන වසරේ ඉගෙනුම ලබන ඒ. බී. ඩී. බී. කාරියප්පෙරුම ද 'සුව දිනක් වේවි හෙට' කාව්‍ය පන්තිය සඳහා ප්‍රස්තුත කරගන්නේ මේ වසංගත තත්ත්වය පහ ව එළඹෙන හෙට දිනය සුවපත් වූ දිනයක් වනු දැකීමේ අරමුණ යි.

රොබරොසියා ඇහැළ - සුවඳ කැලතී හමන
සුළඟ කිම හැපෙන්නේ - විත් විස සුසුම් රැගෙන

කොරෝනා වෛරසය වනාහි සෙම්ප්‍රතිශ්‍යාවේ සිට දරුණු නිදන්ගත ශ්වසන රෝග දක්වා වර්ධනය විය හැකි රෝගාබාධ ඇති කරන්නකි. මෙබඳු වෛරසයක් ආසාදනය වූ පුද්ගලයකුට ශ්වසන රෝග, උණ, කැස්ස, හුස්ම හිරවීම සහ හුස්ම ගැනීමේ අපහසුතා වැනි රෝග ලක්ෂණ ඇති විය හැකි වන අතර අවසානයේ මරණය පවා සිදුවිය හැකි ය. උක්ත කවියෙන් කලාත්මක ව දක්වා ඇත්තේ එකී ආසාදනයේ ස්වරූපය යි. එසේ ම 'කොරෝනා විලංගුව' නමැති කවි පන්තිය රචනා කළ සිංහල

හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ දෙවැනි වසරේ ඉගෙනුම ලබන ඩී. ඒ. ලියනාරච්චි ද උත්සාහ දරා ඇත්තේ කොරෝනා වසංගත තත්ත්වයේ ස්වරූපයත්, ඉන් ජන ජීවිතයේ නිදහස සීමා වූ ආකාරය ගැනත් පැවසීමට ය.

ගිවිසුමක් නැති - කිවිසුමක් මත
දහසකුත් ප්‍රාණ ඇප - ලියා කොරෝනා නමට
කනත්තක් කළා ලොව - මිනී මරා යුද නැතිව
නිදහසේ ගත් හුස්ම පොද - මුකවාඩමක සිර කර
ලෝකයම නතර කළ කොරෝනා විලංගුව

කවියා ධ්වනිතාර්ථවත් කර ඇත්තේ යුද්ධයක් නොමැති ව වුවද මිනිස් ජීවිත බිලි ගැනීමේ හැකියාව තිබූ මේ වෛරසයේ බයානක බව යි. සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ තෙවැනි වසරෙහි ඉගෙනුම ලබන ඩබ්. ජී. ඒෂණ සඳුන්ගේ 'මේ දවස්වල', ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ කේ. ඒ. එස්. මලින්දිකා ධර්මසිරි ලියූ 'අපූරු පාඩම' කවි පන්තිවලින් ද විමසීමට ලක් කර ඇත්තේ වසංගත කාලයේ පෙරළියට බඳුන් වූ මානව ජීවිතය හා සමාජය යි. මලින්දිකාගේ නිරීක්ෂණයට මේ වසංගත සමයේ පාලු වූ නගර කරා ඇදී එන වන සත්ත්වයන් ද හසු වී ඇත.

'එසේ ම වේවා' කවි පන්තිය රචනා කරන දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශයේ සිවුවැනි වසරේ සිසුවියක වන කේ. ටී. නිමාෂා මධුවන්තිගේ වෑයම වී ඇත්තේ ද මෙකී අසීරු වාතාවරණය හමුවේ සොබාදහම හා සමීප වීමේ වැදගත්කමයි. සොබාදහමේ නියමාවලි බණ්ඩණය කිරීමේ අහිතකර ප්‍රතිඵල මේ වනවිටත් අප අත්විඳිමින් සිටින බව පසක් කරවීම යි.

හරිත පැහැ තුරු මුදුනක - නිලැති දිය උපදවන උල්පතක
පිනි බිඳිති තැවරුණු කුසුමක - සිත නිවන කමටහන් ඇත

වසක් ගැවිලා නැති සිසිල් වැස්සක් වී වැටෙමු
විසෙන් හෙම්බත් වුණු පොළෝගැබ නිවේවා යැයි පතමු



අවසානයේ ඇය පවසන්නේ 'සොබාදම් මවුනි අනේ - දැන් මේ දඬුවම - හොඳටෝම ඇති' යනුවෙනි. දෙවැනි වසරේ ඉගෙනුම ලබන දිසාලා රන්දිනි 'හුදෙකලා විය සැවොම' කවි පන්තියෙන් ද උත්සාහ කර ඇත්තේ මිනිසුන් තමන්ගෙන් හා සොබාදහමෙන් ඈත් ව සිටීමෙන් සිදු වූ අනර්ථය පැහැදිලි කරවීමට ය. ඇය මේ යථාර්ථය අවබෝධ කරවූ කාලයක් ලෙස මේ කොරෝනා සමය දකින්නී ය.

මුදල ලෝකය වූ සේපියන්ස්ලාට - කොන්ක්‍රීට් වටපිටාව වූ යුගයක
පවුල තම ලෝකය වී - පරිසරය හදවතට ළං වීය

මේ අදහස ම භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ තෙවැනි වසරේ දුමින්ද නාමල් සිසුවා 'අ-සුන්දර කොරෝනාව' යනුවෙන් ගී ආකෘතියෙන් රචිත කවි පන්තියෙන් මතු කර දක්වා ඇත. එ පමණක් නො ව කොරෝනා වංසගත තත්ත්වය හේතුවෙන් ලෝකයේ සිදු වී ඇති වෙනස ද කාව්‍යාත්මක ව මතු කිරීමට ඔහු අමතක කර නැත.

ලොවම හොල්ලා සිටි බලවතුන් - දැන් ඉන්නේ එල්ලී කොණකින්
ලොවට දුන් ගින්නෙන් - පවු උනුත් දැන් දැවෙනවා ගින්නෙන්

බීජිං මෙන් දිල්ලි අහස ද - හරි පැහැදිලි ය දැකුමට අපට
දූහුලි හා දුම් පැහැයන් වුවද - නැත නැත දැකගැනුමට අපට

ප්‍රතිකාර සොයා නොගත් වෛරස් රෝගයක් අබිමුව අසරණ වූ ජනතාවගේ හදගැස්ම, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ සිවුවැනි වසරෙහි ඉගෙනුම ලබන කේ. එම්. ජී. මධූ වීරසේකර ලියූ 'නිරෝධායනය' නමැති කවි පන්තියට අරමුණු වී ඇත. තමන් කළ හොඳ සහ පින් මේ දුෂ්කර අවස්ථාවෙන් අත්මිදීමට හේතුවන බව පිළිගන්නා ජන විශ්වාසය ඇය මෙහිදී ඉස්මතු කරන්නීය.

තෙවන වසරේ එම්. ඩී. ඒ. සෙව්වන්දිගේ 'කොරෝනාවට තිත තබමු', පළමු වසරේ කේ. වී. ටී. මල්ෂා ලියූ 'මිහිමවගේ දඬුවම', සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ තෙවැනි වසරේ දමිතා

සුදර්ශනී ලියූ 'මිහිකත් මවුනි සමාවන්න' නමැති කවි පන්තිවලින් කියවෙන්නේ ද මිනිසා සොබාදහමට එරෙහි වීමේ ආදීනව යි.

දිනෙන් දින ලොව පුරා මිනිසුන් මිය යාමේ පුවත දමිතා සිය කවියෙන් දක්වා ඇත්තේ මරණය ජාති, ආගම්, වර්ණ-වර්ග භේද නොතකන බව ද උපුටා දක්වමිනි.

මැරෙයි මිනිසුන් කළු සුදු භේද නැතිවම
පොළෝ තලයට මහ බරක්
කප්පරක් මළ සිරුරු එකපිට
දරුණුයි ලැබෙන දඬුවම කළ වරදට
යදිමි සමා අනේ ඔවුනට කමා කරනට

'විස්සේ නිවාඩුව' මැයෙන් කවි පන්තියක් රචනා කරන මානවවිද්‍යා අධ්‍යයනාංශයේ තෙවැනි වසරේ එම්. එස්. මැදගමගේ විමසීමට ලක් කර ඇත්තේ ද මේ වසංගත සමය යි. වෙනදාට දින දසුනේ රජයේ නිවාඩු දින සෙවූ මිනිසුන්ට දින නියමයක් නොමැති ව ලද මේ නිවාඩුව අප්‍රිය වී ඇති අන්දම මෙහිදී සාකච්ඡාවට ලක් කර ඇත.

තෙවන වසරේ සිසුවියක වන පෙම්සිකා පබසරණිගේ 'හිනැහෙමු වස්සානෙට' කාව්‍ය පන්තියේ තේමාව වී ඇත්තේ මේ කාල වකවානුවේ දී පැවති ග්‍රීෂ්මය නිමා කර වැසි වැටීමේ සතුට යි. එම අදහස ම පාදක කරගත් නමුදු ඉන් වෙනත් මානයක් අවලෝකනය කරනා කවි පන්තියක් ලෙස ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ අවසන් වසරේ ඒ. එම්. කේ. විරාජිනී විසින් රචිත 'නොදකින යථාර්ථය' දැක්විය හැකි ය. එහෙත් පළමු වසරේ සිසුවකු වන අවිඳු ශනේෂ්ගේ 'සරදම්' කවි පන්තියට පාදක වී ඇත්තේ වැසි සමයේ නො දුටු පැතිකඩ යි. ඔහු සිය කවි පන්තියෙන් ජනතාව පීඩනයට පත් කළ ග්‍රීෂ්ම වකවානුවත් ඉන්පසු වැටුණු මහ වර්ෂාව නිසා ඇති වූ ඛේදවාචකයත් එක සේ සාකච්ඡාවට පාත්‍ර කර ඇත. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ තෙවැනි වසරේ සිසුවියක වන ඩී. එච්. හේමකුමාරි ද 'වසන්තය යළි එන්න' කවි පන්තියට ප්‍රස්තුත



කොට ගෙන ඇත්තේ වැසි නොමැති ව ගෙවෙන ඉඩෝරය පිළිබඳව යි. එහෙත් ඉන් පවතින දුක්මුසු වාතාවරණය නිමා වී සාමාන්‍ය ජන ජීවිතය උදාවීමේ අපේක්ෂාව ද ව්‍යංගාර්ථවත් වී ඇති බව පෙනේ.

ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශයේ වර්ෂා රණසිංහ සිය 'කොරෝනා කාලේ ආලේ' කාව්‍ය පන්තියට පාදක කරගෙන ඇත්තේ මෙබඳු වසංගත තත්ත්වයක දී නිවෙසට ම සීමා වී සිටීමේ දී ඇතිවූ පසුතැවීමේ මතකස්මරණයයි.

කොරොනා කාලේ - පිය නොතැබූ පාරක් ගැන
කියූ හිස් වදනක් ගැන - සංතාප ඇති කරවිය හැක

වඩා හොඳ ලෝකයක් වෙනුවෙන් - තබනු බැරි වූ සටහනක් ගැන
ආසාධාරණ නිම්නයක් ළඟ - නගනු බැරිවූ උස් හඬක් ගැන
වේදනා දැල්විය හැක

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ තෙවන වසරේ ඉගෙනුම ලබන ටී. ඩී. නිත්‍යා දිල්කි ගයාත්‍රි ද 'කොරෝනා නුඹ සිත යළි පැරුවේ ය' නමැති කවි පන්තියට පාදක කොටගෙන ඇත්තේ නිවසට ම සීමා වී සිටීමේ දී අත්විඳි සිදුවීමකි. කොරෝනා කාලය අතරතුර ඇඳිරි නීතිය ඉවත් කරන ලද දිනවල දී නිවෙසට අවශ්‍ය බඩු භාණ්ඩ මිල දී ගැනීමට ජනතාව මහමග රැඳුණු කාලය ද මීටරයක දුරක් තබා ගැනීමේ නව පුරුදු ද කිවිඳිය මින් සිහිපත් කර ඇත.

මමත් දැන් ගෙදරය - පාරේ හරි සෙනඟ ය
හැමතැන ම පෝලිම් ය
මීටරේ දුර තියන් - සිටින විට පෝලිමේ හුරුපුරුදු මුහුණක් ය
ගිනිගහන දහවලේ - ගත ම සීතල විය
නුඹත් ගම රට පැමිණ බොහො කලක් වාගේ ය
සුදු ගවුම ඇඳි බාලේ - ආදරේ හරිහැටි නො දැන
කළ ප්‍රේමේ ආයමෙත් හමුවෙලා නොදැනීම

ඇය මේ අවදි කර ඇත්තේ ප්‍රේමයේ අතීත මතකයකි. ඊට හේතු වී ඇත්තේ ද කොරෝනා කාලය යි. නිත්‍යා, කොරෝනා සමයේ අත්දැකීමට ප්‍රේමය පාදක කරගන්නා විට පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ අවසන් වසරේ ඉගෙනුම ලබන හතමුණයායේ නන්දාලෝක ස්වාමීන්වහන්සේ 'කොරෝනා හැමතැනම' කවි පන්තියෙන් ඉස්මතු කරවන්නේ වෙනස් ම අදහසකි. මේ අවදියේ එදිනෙදා ජීවිකාව සරිකර දෛනික වැටුප් ලද අය සේ ම මාස්පතා වැටුප් ගත් අය ද කායික මානසික සියලුම ශ්‍රමිකයන් මුහුණ දුන්නේ එක හා සමාන අත්දැකීමකට ය. ගෙවතු වගාවට, හෙළ වෙදකමට, අත් බෙත්හේත්වලට ද මෙරට වැසියෝ එ සමයෙහි පුරුදු පුහුණු වූහ. ස්වාමීන්වහන්සේ කෙටි කාව්‍ය ආකෘතියෙන් රචිත සිය කවියෙන් ඒ ජීවන රටාව ද සිහිපත් කරවා ඇත.

තැන් දෙක තුනක - කොස්, දෙල්, අල, බතල
කොත්තමල්ලි ඇරුනම - දැන් හිතෙත් -
කොරෝනා ලක්ෂණ - හැමතැන ම

මානව විද්‍යා අධ්‍යයනාංශයේ සිව්වෙනි වසරේ ඉගෙනුම ලබන ජී. ඒ. ඒ. එන්. ශ්‍රීහාන්, කොරෝනා වසංගතය හේතුවෙන් ඒකාකාරී ජීවන රටාවකට හුරු වූ කුඩා දරුවන්ගේ ජීවිතයට සිදු වූ සුබදායි වෙනස ගැන 'කොරෝනා හා ඩේ කෙයාර් දරුවෝ' නමැති සිය කවි පන්තියෙන් අවධානය යොමු කර ඇත. ඔහු මේ කවි පන්තිය විකාශනය කර ඇත්තේ ද කුඩා දරුවකුගේ දෘෂ්ටිකෝණයෙනි.

ඉස්සරට දැන් වඩා වැඩියෙන් ගෙදර ආදරෙ මට ම උරුමයි
තාත්තගෙ අම්මගේ තුරුලෙම දැවටි දැවටී ඉන්න ආසයි
කළු වලාවක උනත් රිදියෙන් රේඛාව ඇඳෙනවා සිකුරුයි
අයෙමත් ඩේ කෙයාර් එකෙ නම් ඉන්න වෙන්නැති ලකුණු පහළයි
'කොරෝනා' උඹ ලෝකයට අද කියා දුන් පාඩම අපූරුයි !

පවතින තරගකාරී සමාජ ක්‍රමය හමුවේ දුරස් වන දූදරු, මානව සබඳතාවල බේදණීය ස්වරූපය මෙහි දී ශ්‍රීහාන් අපූර්ව



ආකාරයෙන් ප්‍රතිනිර්මාණය කර ඇත. එසේ ඇත් වූ මානව සබඳතා කොරෝනා හේතුවෙන් නැවතත් සවිමත් වෙද්දී මෙබඳු හදිසි තත්ත්ව මැඩ පැවත්වීමට දායක වෙමින් සමාජ ආරක්ෂාව වෙනුවෙන් කැප වූ පොලිස් නිලධාරීන්ගේ පවුල්වල තත්ත්වය, සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ අවසන් වසරෙහි අයි. ගංගා නිරෝෂණී සිය කවියට පාදක කොට ගෙන ඇත.

මතක ඇති දාක බත් කටක් කවන්නට - නුඹ ආවෙ නෑ ගෙදර
රට ම බත් කන දාට - මුරකාවල් රකින
ලබන අවුරුද්දෙ එනවා ඔන්න - තාත්තා කිව්වෙ එහෙම
අවුරුදු ගණන් මැවූ හීනය - සැබෑ වෙන්න පැතුව මේ ගමන
කොරෝනා උඹ කලි හදිය

ගංගා මෙහි දී සිය අවධානය යොමු කර ඇත්තේ ජීවිතයේ වැදගත් ම දවස් සිය රැකියාව හේතුවෙන් අහිමි කරගන්නට සිදුවූ පියවරුන් ගැන ය; ඊට මුහුණ දෙමින් කුටුම්භයේ බර කරට ගත් මව්වරුන් ගැන ය; පිය සෙනෙහස විඳින්නට නො හැකි ව එය තනිව දරා ගන්නා දරුවන් ගැන ය. එසේ ම පළමු වසරේ බී. සචිනි සුරංගිකා ධර්මසේන ලියූ 'මැව්වේ සිහින ළංවෙන්නයි නුඹට පුතේ' කවි පන්තියෙන් කියවෙන්නේ මෙහි අනෙක් දෘෂ්ටිකෝණය යි. එනම්, හමුදා සේවයෙහි යෙදෙන පියකුගේ හැඟීම යි. මෙම කාව්‍ය පන්තිය ඍජුව ම කොරෝනා කාලය සිහිපත් නො කළ ද ආරක්ෂක සේවයේ යෙදෙන නිලධාරීන්ගේ ජීවිතයේ නො පෙනෙන පැතිකඩ හෙළිදරව් කර ඇත.

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ අවසන් වසරේ සිසුවියක වන ආර්. ඒ. එස්. සෙව්වන්දි 'ගැබ්බර මවකගේ සිතුවිල්ලක්' යනුවෙන් දක්වා ඇත්තේ තවත් වෙසෙස් අනුභූතියකි. කොරෝනා ආසාදිත රෝගීන් සිය රෝග ඉතිහාසය සඟවමින් රෝහල්ගතවීම හේතුවෙන් වෛද්‍යවරු ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලය මුහුණ දුන්නේ බරපතල ගැටලුවකට ය. එයින් ඇතැම් පෞද්ගලික රෝහල් ද, ඇතැම් ආරෝග්‍යශාලාවල එක් එක් කොටස් ද වසා දැමීට හා කාර්ය මණ්ඩල නිරෝධායනයට ලක් කිරීමට ද සිදු

විය. සෙව්වන්දිගේ අවධානය යොමු වී ඇත්තේ එබඳු තත්ත්වයක් හමුවේ සිය දරුවාගේ නිරුපද්‍රිත උපත අපේක්ෂාවෙන් බලා සිටින ගැබ්බර මවකගේ සිතුවිලි ය.

කිරි සිහින ගැන මතක - මගෙ හිතේ පුරෝගෙන
මැවුවා උඹෙ රුව මා හද තුළ
ලෝකය ම ගිලන් වෙලා - ගල් ගැසී බලා ඉන්නා මොහොතක
උඹ එන්නෙ කොහොමද මගේ තුරුලට

ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශයේ දෙවැනි වසරේ සිසුවියක වන ඩබ්. ඩබ්. ශෂීප්‍රභා මධුෂානි 'පොඩි එකී අඳුරට බයයි' කවි පන්තියට පාදක කරගෙන ඇත්තේ මේ කාල වකවානුවේ දී මනුෂ්‍යත්වය පිරිහෙමින් තිබෙන ආකාරය යි. ඇයට ඒ සඳහා නිමිති වී ඇත්තේ වසංගත සමයේ සොරකම් කළායැයි ගම්වාසීන් විසින් ලයිට් කණුවක බැඳ දැමූ මිනිසකු පිළිබඳ සමාජ මාධ්‍යවල පළ වූ ඡායාරූපයකි.

කුලී වැඩ නෑ මාසෙකින් මට - වටපිටේ හැමටම ණයයි
වැඩක් තිබ්බත් වද්ද ගන්නෑ - කොරෝනට සේරම බයයි

මෙබඳු වසංගත තත්ත්ව හමුවේ අසරණ බවට පත්වන පහළ පාන්තික මිනිසුන්ගේ හදවතේ රාවය මධුෂානි සිය කවියෙන් අනාවරණය කර ඇත. ඇය පාඨක සිත් කම්පනයට පත් කර ඇත්තේ මව් සෙනෙහස අහිමි වූ දරුවන් වෙනුවෙන් දුක් ගන්නා පියකුගේ හදවතේ හඬට සහෘද හදවත් සංවේදී කරවන අපූරු කවිතාවකිනි.

ගහේ බැඳලා තැලුවමුත් මට - කාරි නෑ දැන් දුක හුරුයි
මේ දැනුත් මට මතක් වෙන්නේ - අම්ම නැති පොඩි උන් ගැනයි

ආයෙ නම් හොරකම් කරන්නෑ - හාමතේ මැරුණත් සැපයි
පහ හමාරට යන්න දෙනවද - පොඩි එකී අඳුරට බයයි

'හීන්දෑරි කතක්' රචනා කළ දෙවැනි වසරේ ඉගෙනුම ලබන ආර්. ඒ. එම්. එස්. සෙව්වන්දි ද සිය කවියෙන් ධ්වනිතාර්ථවත් කර



ඇත්තේ යට කී සමාජ යථාර්ථය ම ය. මෙහි දී ඇයගේ අවධානයට පාත්‍ර වී ඇත්තේ මවකි.

නැත පයෙහි දැවටෙනා යමක් - නැත දරු පැටවුන්ට අලයක්
නැත කොත්තමල්ලී ඇටයක් - ඇත හිතේ කොරෝනට බයක්

හිස පිසින මඩ තැවරුණු දෑතක්
වැහැරී දහඩියට පෙගුණු කෘෂ ළැමක්
මලානික කඳුළු බර දුක්ඛිතම දෑසක්
සුසුම්ලන හදවතක් සතු ඇයත් කතක්

මෙවැනි වසංගත හේතුවෙන් වඩාත් දුක්ඛිත බවට පත්වන්නේ එදාවේල සරි කර ගැනීමට නොහැකි ව දුක් විඳින මෙබඳු මිනිසුන් බව සෙව්වන්දි සිය කවියෙන් ඉස්මතු කරවන යථාර්ථය යි.

පාසල්, විශ්වවිද්‍යාල තාවකාලික ව වසා දැමීම හේතුවෙන් අඩාල වූ අධ්‍යාපනය යාවත්කාලීන කිරීම උදෙසා ලොව පුරා රටවල් අන්තර්ජාලය උපයෝගී කරගත්තේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙරට බොහෝ පාසල් ද විශ්වවිද්‍යාල ද අන්තර්ජාල ඉගැන්වීම් සඳහා එක්වූයේ ය. එහෙත් එය සුකර කාර්යයක් නො වේ. දෙවැනි වසරේ ඉගෙනුම ලබන එම්. එම්. තාරක ප්‍රභාත් ජයසුන්දර සිසුවා සිය 'ඔන්ලයින් ඉස්කෝලේ' සඳහා පාදක කරගන්නේ එකී සිදුවීම යි.

නගරෙ වැඩබිම දහඩියට පඩි නැතුව අප්පච්චිට ඉඩක්
ලෙඩ ඇඳේ ඉඳ බතට ලිප් බැඳ අම්මාට නැත නිදහසක්
ඒක හින්දම කන්ද අද්දර හේනකට තබලා පයක්
වැස්සුවා පොත මගෙන් ඈතට කරන්නට ඇත වැඩ ගොඩක්

රූප පෙට්ටියේ උගන්වනවලු ටීචලා ඇවිදින් හුඟක්
මමත් දන්නේ කීව පසු පන්තියේ හම්බුණු යාලුවෙක්
ගෙදර වැඩ එක දිගට දෙනවලු ඉස්කෝලේ යනවලු ලොකු වැඩක්
කොහොම හරි ඔන්ලයින් එන්නලු ඒක මට ලොකු හීනයක්

අම්මගේ ලෙඩ තුණ්ඩුවට බෙහෙතක් ගෙනෙන්නට කඩපිලෙන්
ඔන්ලයින් ඉස්කෝලේ දැක්කා යද්දී වීදුරු ජනේලෙන්
හිතේ අහිතක් කුමට අද මට පෙගුණු ඇස් හැර කන් දෙකෙන්
දන්නවද දැන් අසම් පාඩම් රුහුණු සේවා තරංගෙන්

තාරක, අඳුරට සාප කරනු වෙනුවට සිය කවියෙන් උත්සාහ දරා ඇත්තේ පහනක් පත්තු කිරීමට ය. ඩේටා, වට්ස්ඇප්, ස්මාර්ට් ජංගම දුරකථන සහ රූපවාහිනී නැති දරු දැරියන්ට රුහුණු සේවයෙන් සැලසෙන සෙත තාරකගේ ඇගයීමට ලක් කර ඇත. රුහුණු සේවයේ මේ ප්‍රජා සත්කාරය අගයන තාරක වෙසෙන්නේ බලංගොඩ වීම අනෙක් විශේෂත්වය යි.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ අවසන් වසරේ එල්. එල්. ඩී. ඩී. ඒ. රූපසිංහ ලියූ 'ඇඳිරිනීතියේ අපි' කවි පන්තියෙන් දක්වා ඇත්තේ මේ වසංගත සමයේ සාමාන්‍ය ජන ජීවිතයට සිදු වූ වෙනසත් ඊට ඇති නො කැමැත්තත් ය.

මේ හැරුණු කොට වෙනත් විෂයයන් මාතෘකා කොට ගත් කවි පන්ති ද දැකිය හැකි විය. අලුත් ටීචර්, මැදින් ප්‍රේමයේ නිරිතදිග මෝසම්, විභාගය ඒවා ය. ඒ අතුරින් 'විභාගය' නමැති කවි පන්තියෙන් දෙවැනි වසරේ එස්. ගුරුසිංහ විසින් පවතින අධ්‍යාපන ක්‍රමය හමුවේ විභාග මානසිකත්වය හේතුවෙන් දරුවන් අත් විඳින පීඩාව මනාව ඉස්මතුකොට දක්වනු ලැබ ඇත.

## සමාලෝචනය

'දිසි විදැසි'හි අනතර්ගත මේ සියලු කවි පන්ති අතුරින් කවීත්වයෙන් හා නිසග ප්‍රතිභාවෙන් අනූන කවි පන්ති ඇත්තේ කිහිපයක් පමණි. බොහෝ කවි පන්ති, සුසුම් පද හා සක්ක පදවලින් ගහණ ය. කාව්‍ය ශක්තියෙන් පොහොසත් නැත. එසේ වුව ද මේ සියලු සිසු සිසුවියන්ට පාදක වී ඇත්තේ තත් කාල වකවානුවේ ඔවුන් අත්විඳි අනුභූතීන් ය. තව ද මේ සිසු සිසුවියෝ විවිධ විෂය ක්ෂේත්‍ර නියෝජනය කරන අය වෙත්. ඔවුන් උදක් ම උත්සාහ දරා ඇත්තේ පැවති වාතාවරණය, සිය නිර්මාණවලින් ඉස්මතු කර දැක්වීමට



ය. මෙහිලා අපගේ වෑයම වූයේ ද එකී සමාජ පසුබිම විවරණය කිරීමට ය. ඔවුන්ගේ කවියෙහි තත් සමාජ පසුබිම එයාකාරයෙන් ම නිරූපණය වී තිබුණි. එක් දිනකට පමණක් සීමා වූ නවක සිසුන්ගේ සංතාපය ද සිවු වසරක් අධ්‍යාපනය ලැබ උපාධියෙන් අභිෂේක ලැබීමට ආසන්න වී තිබියදී එය පමා වූ අවසන් වසරේ සිසුන්ගේ අපේක්ෂාභංගත්වය ද මේ කවිවල අපූරුවට මූර්තිමත් වී තිබුණි. තව ද පෙර වසරේ පාස්කු ප්‍රහාරයෙන් කතෝලික ප්‍රජාව විඳි වේදනාව ද වසර දෙකක්ම වෙසක් උත්සවය සැමරීමට නො හැකි වූ බෞද්ධයන්ගේ ශෝකය ද මේ කවි පන්තිවලට පාදක වී තිබුණි. දිගු කලක් තිස්සේ මිනිසුන් පීඩාවට පත් වූ ඉඩෝර කාලය නිමා වීමේ සතුට ද වට වැසි නිසා අවතැන් වූ ජනතාව ගැන උපන් සංවේගය ද සරසවි සිසුන් සිය කවිවලට මාතෘකා කරගෙන තිබුණි, විශ්වවිද්‍යාලට පැමිණීමට නො හැකි ව මිතුරු සමාගමයෙන් ඈත් ව ගෙවන මේ කාලය බොහෝ සිසුහු සිය කවියට ප්‍රස්තුත කරගත්හ. ඒ වේදනාව, විශ්වවිද්‍යාලය ජපුර මව ලෙස හැඳින්වීමෙන් ම පැහැදිලි වේ. එ මෙන් ම මේ කාල වකවානුවේ රෝගී වූ සමාජය නිරෝගී කිරීමට අප්‍රතිහත ධෛර්යයෙන් වෙහෙස මහන්සි වන සුව සේවා විරුවන් කෙරෙහි වූ කෘතවේදිත්වය ද දැකිය හැකි විය. කොවිඩ්-19 වෛරසය හේතුවෙන් නව පුරුදු හා චර්යා රටාවලට හුරුපුරුදු වීමට සිදු වූ සමාජය ද ඊට එල්ල වූ ප්‍රතිවිරෝධය ද මේ කවිවල අන්තර්ගත විය. සමස්ත සමාජයේ ම මානව සබඳතාවල සිදු වූ වෙනසත් ආදරය, යුතුකම් හා වගකීම් අභියෝගයට ලක්වෙන ආකාරයත් මේ කවි සියුම්ව නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි ව ම හඳුනාගත හැකි වීම අනෙක් විශේෂත්වය යි. මේ අනුව පැහැදිලි වන්නේ 'දිසි විදැසි' පද්‍යකාව්‍ය සංග්‍රහය වනාහි තත් සමාජ පසුබිම පිළිබිඹු කරන මනා කැඩපතක් බව යි; මෙකී කාල වකවානුව අමතක නො වන සේ මනාව සංගෘහිත කළ සාහිත්‍යයක් බව යි.

## 01.
## ජීවක මහිම

අළුපාට මායාව කොරෝනා
ලෝකයම වසාගෙන ගිලුවා,
ඒ මැදින් මතු වූ දෙවියා
වසාගෙන මුළු ගත ම සිටියා..

පරපුරක් ස්නේහයෙන් රකිනා
වෙද ඇදුරු, අය ඇතුළු හමුදා
ගිලන් හද රැකගන්න නිති වෙහෙස දැරුවා

ජීවයක් රැකගන්න - මැරුණු හිතේ පණගන්න
කාටවත් නො පෙන්වූ - ළය මඬල සැඟ වූ
ප්‍රේමයේ මල් ඉන්න සෙනෙහසින් පිදුවා
බුදුන් කල සිටන් එන ජීවකගෙ අත් ගුණය
අංශුවක් පාසාම සිත්මලෙන් ඉස්සා..

බුද්ධිකා පියුමාලි, ඇල්පිටිය
දෙවන වසර - පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
2020. 04. 03



## 02.
## කොරෝනා කාලේ ආලේ

කොරොනා කාලේ
පිය නොතැබූ පාරක් ගැන
කියූ හිස් වදනක් ගැන
සංතාප ඇති කරවිය හැක

වඩා හොඳ ලෝකයක් වෙනුවෙන්
තබනු බැරි වූ සටහනක් ගැන
ආසාධාරණ නිම්නයක් ළඟ
නගනු බැරිවූ උස් හඬක් ගැන
වේදනා දැල්විය හැක

වැසි පොදක් සේ නොවැසි සමයට
දෝෂාරෝපිතය හෘදය
කොරොනා කාලේ ආලේ
මේ යැයි කියා පෙන්වයි
ජීවිතේ මග හැරුණු අර්ධය

වර්ෂා රණසිංහ - පන්නිපිටිය
සිවුවැනි වසර - ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශය
2020. 04. 04

## 03.

## වෙදැදුරනි පින් බෝම

සැඩ කොරෝනා මැදින් - දිවි සයුර තරණයට
හබලක් ව නුඹ පැමිණ - සවිය විය දිරි ගන්ට

අනුන් හිත සුව පතා - නොගෙන කිසි ඉසිඹුවක්
වගුළ හැම දා බිඳම - මුතු කැටය, කරුණාවේ

වැළඳගනු නොහැකිවන - හිත මිතුරු හදවත්
තනි තනිව පීඩිතව - මරණයේ දොර ගාව
ජීවිතය ඉල්ලාන - නුඹ ළඟට ආ විගස
හැකිනම් පණත් දේවි - කිසිවකුත් නොකියාම

කිරි මව්වරුන් වෙත සිය පුතුව භාර කළ
ප්‍රජාපතියක් සේම - අන් දරුට මව් වූව
අත දරුව නිවහනේ - නැන්දම්මලා ගාව
රෝහලේ හැම දෙනට - මොවුන් මව්වරු වීය

ලොවක් සසල වූ මොහොතේ - රෝ බියෙන් ආතුරව
සියලු සත වෙත පතළ - කරුණාවේ රැස් දහර
මිනිස් වෙසකින් ආව - වෙදැදුරනි පින් බෝම
වැන්දාට පව් නොමැත - දෙවිවරුය නුඹ සැම

ජී. කවිඳු සුභාෂ් - දෙල්ගොඩ
තෙවැනි වසර - සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේද අධ්‍යයනාංශය
2020. 04. 05



## 04.

## කොරෝනා හා ඩේ කෙයාර් දරුවෝ

පුංචි කාලෙම ඉඳන් මතකයෙ කොහේ හරි අඩුවක් තියෙන්නැති
අම්මගේ තුරුලකට ගොඩවුණු දවස් අතැඟිලිවලින් ගන්නැති
ලුණු කරේ ගෙනියන්න දන්නැති තාත්තගෙ හැඩහුරුව මැකිලැති
ඒක හින්දම 'ඩේ කෙයාර්' එකේ තනිවෙච්ච දුක හිත පෙළැන්නැති

''කොරෝනා'' කිය කියා නිතර ම ඔරෝනා අප්පච්චි ගෙදරයි
''වැඩට යන්නට ඕනෑ නෑ දැන්'' කියා සැනහෙන අම්මා නිවනයි
වසර ගාණක් ගිහින් හරියට දවල් ගෙදරම උන්නු හන්දයි
මොකද්දෝ සන්තෝසකින් වගෙ හිත ම පිරිලා අනේ ! ඇත්තයි

අම්මාගේ රස කෑම මතකය ආයෙමත් දිව නහර පිනවයි
තාත්තාත් දැන් ගෙදර ඉඳගෙන මාව ලුණු කරේ තියාගෙන යයි
ආදරේ මැද හිනාවෙන්නට කලක සිට බෝ ඇඟිලි ගැන්නයි
කොරෝනාවට බොහොම පින් ! දැන් ''ඩේ කෙයාවට'' යන්නෙ නෑ මයි

උදේ ඉස්කෝලෙට වෙලා හවසටත් පන්තියෙට කොටුවෙලා
පන්ති නැත්තං ඩේ කෙයාර් එකේ කාල සටහනෙ හිරවෙලා
ශිස්සත්වෙ කිය කියා කවුරුත් පන්න පන්නා එළවලා
තිබ්බ කාලෙක කරදරේ දැන් වෛරසේ මට අඩු කළා

ගෙදර වැඩ දුන් ඒවා දැන් මම කරන්නේ අම්මලා එක්කයි
වැරදි වෙන තැන් පෙන්නලා මට කියාදෙන්නේ මගෙ තාත්තයි
ආදරේ අප ළඟට එන්නේ බොහෝ විට කරදර ම එක්කයි
'කොරෝනා' හින්දාම දැන් අපෙ ගෙදර එකතුව සම්පූර්ණයි

ඉස්සරට දැන් වඩා වැඩියෙන් ගෙදර ආදරෙ මට ම උරුමයි
තාත්තගෙ අම්මගේ තුරුලෙම දැවටි දැවටී ඉන්න ආසයි
කළු වලාවක උනත් රිදියෙන් රේඛාව ඇඳෙනවා සිකුරුයි
අයෙමත් ඩේ කෙයාර් එකෙ නම් ඉන්න වෙන්නැති ලකුණු පහළයි
'කොරෝනා' උඹ ලෝකයට අද කියා දුන් පාඩම අපූරුයි !

පී. ඒ. ඒ. එන්. ශ්‍රීශාන් - පන්නිපිටිය
සිවුවැනි වසර - මානවවිද්‍යා අධ්‍යයනාංශය
2020. 04. 06

## 05.
## ''සියලු පොලිස් නිලධාරීන්ගේ නිවාඩු අවලංගු කෙරේ'' - පුවතක්

මතක ඇති දාක බත් කටක් කවන්නට - නුඹ ආවෙ නෑ ගෙදර
රට ම බත් කන දාට - මුරකාවල් රකින
ලබන අවුරුද්දෙ එනවා ඔන්න - තාත්තා කිව්වෙ එහෙම
අවුරුදු ගණන් මැවූ හීනය - සැබෑ වෙන්න පැතුව මේ ගමන
කොරෝනා උඹ කලි හදිය තාත්තාට නිවාඩු නෑ පුතේ
- මග බලන ඇස් දෙකට අම්මා කීවා එහෙම

අයි. ජී. නිරෝෂණී - මාතර
සිවුවැනි වසර - සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
2020. 04. 07

## 06.
## රකිම් මව්බිම

උපන්දා සිට මා - නොයෙක් දුක් ගැහැට මා වෙනුවෙන් ඉවසා
මා ලොකු මහත් වනු දැක - නේක නේක සිහින දැක
ඉමහත් ස්නේහයෙන් - සතුටු වූ ඔබ දෙපළ
සරසවි බිමට පිය මැන - මා ලද සරසවි වරම
අනාගත සොයුරන්ට සුරැකිව ලැබුමට අරගල කරන විට මා
නෙතේ කඳුළක් උනනු දුටුවා - අඳුරු වූ ඔබේ මුවින්
නමුදු අද මා ණය නැති පුතෙක්
මව්රට රකින්නට කොරෝනා මරුවාගෙන්
හදම් නෙක නෙක - නොයෙක් නිපැයුම් රකිම් මව්බිම

චාපා නිපුනි වාසනා - කළුතර - පළමු වසර
2020. 04. 08



## 07.
## තනි කළා නෙවෙයි අම්මේ

ආදරේ උල්පතයි ජපුර අම්මේ නුඹත්
නැහැවුණේ එයින් අප නැගෙන පෙණකැටි ලෙසත්
කුණාටුව හමාවිත් දුරට අප ඇදුනමුත්
රැදුණෙ නුඹෙ තුරුලෙමයි එදා මෙන් අද හෙටත්

කුසයෙ නුඹෙ අරක් ගත් දරු කැලට වූ විපත
දරා මල් වගුරවයි සනසවන්නට දෙනෙත
දස අතම හමා යයි කොරොනා වසංගත
අම්මේ නුඹ ඉවසන්න කියන මේ දුක් පුවත

කොරෝනා දරුණුයිලු අම්මෙ වියපත් අයට
කතා කෙරුවත් ඇතිලු බෝ වන්න අන් සැමට
බෙහෙත් කෙරුවත් මදිලු අනේ වයසක අයට
රැකගන්න අම්මාව හනික දිව්වේ දුරට

වසන්තෙට පිපී ආ කඳුළු ඇදහැලෙනවද?
තවම ඉස්සර වාගේ සැඟව ඉකි බිඳිනවද?
ලේ නහර කිලිපොළවා දරු සෙනේ දැනෙනවද?
අම්මේ දැන් හැඬුව ඇති නුඹ ටිකක් නිදියනවද?

හංසි එස්. ප්‍රනාන්දු - නාත්තන්ඩිය
තෙවැනි වසර (සාමන්‍ය උපාධි)
2020. 04. 09

## 08.

## වසන්තය යළි එන්න

ඉඩෝරයක සැගවිච්ච වතුසුද්ද මල් පොකුර
හොර හොරෙන් එබී එබී පාන හරි සිරියාව
හමා ආ සැඬ සුළඟ කඳුළකට අත වැනුව
පිපිණු වතුසුද්ද මල බිම හෙළා රුදුරු ලෙස
නොපිපි මල් පොහොට්ටු ඉකිබිඳින කඳුළු කැට
මිහිකතට බර වැඩිලු දාරගන්නට නොහැකිවන
අයදින්නට වැහි බිඳක් කඳුළු සේදී යන්න
වසන්තය යළි එන්න ඉඩෝරයට සැඟවෙමින

**ඩී එච් හේමාකුමාරි - ගොඩකවෙල**
**තෙවන වසර - පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය**
**2020. 04. 10**



## 09.

## එසේම වේවා

බරැති සිහින පොදි බිම තබා
මගහැරුණු දයාබර හිත් කියවමු
දුර වුවද ළඟ වුවද නොගිලිහෙන
දයාබර අත්වැල තදින් අල්ලාගනිමු

හරිත පැහැ තුරු මුදුනක
නිලැති දිය උපදවන උල්පතක
පිනි බිඳිති තැවරුණු කුසුමක
සිත නිවන කමටහන් ඇත

මනස් ඇස සැහැල්ලුය
දෙනෙත් හැර ලොව බලමු
නෙතක් නැති තැන්වල
මල් නොපිපෙනා වග දකිමු

වසක් ගැව්ලා නැති සිසිල් වැස්සක් වී වැටෙමු
විසෙන් හෙම්බත් වුණු පොළෝ ගැබ් නිවේවා යැයි පතමු

සොබාදම් මව්නි - අනේ දැන් මේ දඬුවම
හොඳටෝම ඇති

**කේ. ටී. නිමාෂා මධුවන්ති - මහරගම**
**සිවුවැනි වසර - දර්ශනය සහ මනෝ විද්‍යා අධ්‍යයනාංශය**
**2020. 04. 11**

## 10.
## කොරෝනා විලංගුව

ගිවිසුමක් නැති - කිවිසුමක් මත
දහසකුත් ප්‍රාණ ඇප
ලියා කොරෝනා නමට
කනත්තක් කළා ලොව - මිනී මරා යුද නැතිව...
නිදහසේ ගත් හුස්ම පොද
මුකවාඩමක සිරකර
ලෝකයම නතර කළ - කොරෝනා විලංගුව
අරින්නේ කවදාද - මනු දෙපා විලංගුව

**ඩී. යූ. ලියනාආරච්චි - ඇල්පිටිය**
**දෙවැනි වසර - සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය**
**2020. 04. 12**



## 11.
## බලා ඉන්නම් අම්මේ

අවුරුදු දහතුනක් ගෙවිලා ගියා
නව ගමනක පිය සටහනක ඇරඹුමකින්,
තවමත් එතනමයි 2020ත් ලැබුවා

තුන්මසකුත් ගෙවුණා, මතක පිටු සිත්තම් කරමින්,
රොබරෝසියා මල් පාඩව එළුවා
සහෝදරත්වයේ දෑත් දකිමින් පියනැගුවා,
වන්නට දහඩිය කඳුළක පවනක් සිතමින්

අහස්තලයම අඳුරු කරන් - තැබූ පියසටහන් සේදීගියා
සිත්මල් දහස් පරව ගිහින්

දරාගැනීමක ඇරඹුම් අඳෝනාව රාව නංවා
මහී කත අකීකරු කමට කෙවිටක් අරන්
බිඳුණු සෙනෙහසක වියරුව දුටුවා
ආදරය කරන්නට පටන් ගමු මව්ට හදින්
පරක්කු වැඩි ද මන්දා

බලාපොරොත්තු දෑස් අග දල්වා
කොළඹ අහස යටට ඇවිදින්
රොබරෝසියා මල් සුවඳ විඳින තුරා බලා ඉන්නම් අම්මේ...

රජරට කර්කශ පොළෝ තලයට
ඔට්ටු වන දෑතට සවියක් වන්නට සිහින මවමින්
හීනයක් නොවී පරිස්සමින් ඉන්න
දිනයක උණුසුම විඳි දරුවෙකි මා...

**කේ. පී. එන්. ප්‍රේමරත්න - පොළොන්නරුව - පළමු වසර**
**2020. 04. 13**

## 10.
## කොරෝනා විලංගුව

ගිව්සුමක් නැති - කිව්සුමක් මත
දහසකුත් ප්‍රාණ ඇප
ලියා කොරෝනා නමට
කනත්තක් කළා ලොව - මිනී මරා යුද නැතිව...
නිදහසේ ගත් හුස්ම පොද
මුකවාඩමක සිරකර
ලෝකයම නතර කළ - කොරෝනා විලංගුව
අරින්නේ කවදාද - මනු දෙපා විලංගුව

ඩී. යූ. ලියනාආරච්චි - ඇල්පිටිය
දෙවැනි වසර - සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
2020. 04. 12



## 11.
## බලා ඉන්නම් අම්මේ

අවුරුදු දහතුනක් ගෙවිලා ගියා
නව ගමනක පිය සටහනක ඇරඹුමකින්,
තවමත් එතනමයි 2020ත් ලැබුවා

තුන්මසකුත් ගෙවුණා, මතක පිටු සිත්තම් කරමින්,
රොබරෝසියා මල් පාඩව එළුවා
සහෝදරත්වයේ දෑත් දකිමින් පියනැගුවා,
වන්නට දහඩිය කඳුළක පවනක් සිතමින්

අහස්තලයම අඳුරු කරන් - තැබූ පියසටහන් සේදීගියා
සිත්මල් දහස් පරව ගිහින්

දරාගැනීමක ඇරඹුම් අඳෝනාව රාව නංවා
මහී කත අකීකරු කමට කෙවිටක් අරන්
බිඳුණු සෙනෙහසක වියරුව දුටුවා
ආදරය කරන්නට පටන් ගමු මව්ට හදින්
පරක්කු වැඩි ද මන්දා

බලාපොරොත්තු දෑස් අග දල්වා
කොළඹ අහස යටට ඇවිදින්
රොබරෝසියා මල් සුවඳ විඳින තුරා බලා ඉන්නම් අම්මේ...

රජරට කර්කශ පොළෝ තළයට
ඔට්ටු වන දෑතට සවියක් වන්නට සිහින මවමින්
හීනයක් නොවී පරිස්සමින් ඉන්න
දිනයක උණුසුම විඳි දරුවෙකි මා...

කේ. පී. එන්. ප්‍රේමරත්න - පොළොන්නරුව - පළමු වසර
2020. 04. 13

## 12.

## නොකියාම ආපු ඔයාට

නොකියාම ඇවිදින් - අපිට අපි වෙන් කළත්
හිතුවෙම එය අදත් - මං දැක්ක හීනයක්
නුපුරුදුයි තනිකමෙන් ගෙදරටම වී ඉන්න
මතක් වෙනවා නිතර හද බැඳුණු මිතුරු කැල

විසි එකේ බෙර හඬට පද සුරල් පාගන්න
කොට්ටම්බ හෙවණ යට තවත් දොඩමලු වෙන්න
නිදිගත්ත හීනයෙන් අපට යළි ඇහැරෙන්න
කොරෝනා ඉක්මනින් අප දමා ඔබ යන්න

ඩබ්. ඩබ්. ඒ. සී. සන්දීපා - දෙනියාය, තෙවැනි වසර -
භාෂා සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසාංගික කලා අධ්‍යයනාංශය
2020. 04. 15

## 13.

## කොරෝනා නුඹ සිත යළි පෑරුවේ ය.

මමත් දැන් ගෙදරය - පාරේ හරි සෙනඟ ය හැමතැන ම පෝලිම් ය
මීටරේ දුර තියන් - සිටින විට පෝලිමේ හුරුපුරුදු මුහුණක් ය
ගිනිගහන දහවලේ - ගත ම සීතල වීය
නුඹත් ගම රට පැමිණ බොහො කලක් වාගේ ය
සුදු ගවුම ඇඳි බාලේ - ආදරේ හරිහැටි නො දැන
කළ ප්‍රේමේ ආයමෙත් හමුවෙලා නොදැනීම
කොරෝනා නුඹ මාව - ගෙනගියා වසර ගාණක් ආපස්සට

ටී. ඩී. නිත්‍යා දිල්කි ගයාත්‍රි - මාතලේ
තෙවැනි වසර - සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
2020. 04. 16



## 14.

## හුදෙකලා විය සැවොම

හුදෙකලා විය සැවොම තම තම ලෝක තුළ
එතෙක් නොවැටහුණු සත්‍යය
පසක් වී ගෙන එන රස

මුදල ලෝකය වූ සේපියන්ස්ලාට කොන්ක්‍රීට් වටපිටාව වූ යුගයක
පවුල තම ලෝකය වී පරිසරය හදවතට ළංවිය

දින, සති ගණන් වේවිලු
ඒත්, පෙරළුණු පිට හොඳයි කීවලු
මට මාව මුණගස්සපු - මට අපිව තේරුම් කර දීපු
කොරෝනත් ඔහේ ආපිට යයිලු
ඒත් ඒ ජීවන පාඩමට මිනිස්සු බයයිලු
ඒත් ටික කාලයයි ලු

දිසාලා රන්දිනි විමලසේන - කෑගල්ල - දෙවැනි වසර
2020. 04. 17

## 15.

## අ-සුන්දර කොරෝනාව

හැකිවුවද මාහට - නොහැක යන්නට එළියට
මියෙන මිනිසුන් දැක මට - හැඬෙනවා ජීවිත අනියත බියට

මිනිසුන් වුණ අප සියලු දෙන - අවභාවිත කළා වගේ පෘථිවිය
එසේ මට සිතුණු වාර අනන්තය - තාම දැනෙනවා කොරෝනා බිය

ලොවම හොල්ලා සිටි බලවතුන් - දැන් ඉන්නේ එල්ලී කොණකින්
ලොවට දුන් ගින්නෙන් - පවු උනුත් දැන් දැවෙනවා ගින්නෙන්

බීජිං මෙන් දිල්ලී අහස ද - හරි පැහැදිලි ය දැකුමට අපට
දූහුලි හා දුම් පැහැයන් වුවද - නැත නැත දැකගැනුමට අපට

ඒමේ අතේ දුවති සියොතුන් - වැල් දුවයි ගස්වලද එතෙමින්
නැත පරව නැත කුසුමන් - දැන් ඉන්නෙ උනුත් සතුටින්

හරිම විදියට හිතුවොතින් අපට - කොරෝනා ඇඳිරියේ වුව ද
බිහිකළ හැකිය නව දේ ලොවට - පරිසමින් කරනුමැන මොන දේ වුවද

බුදුන් සරණයි මගේ මව්බිමට - දහම් සරණයි මගේ මව්බිමට
සඟුන් සරණයි මගේ මව්බිමට - තුතියි වෙද මෙන්ම විරුවනි නුඹට

**දුමින්ද නාමල් - ආනමඩුව**
**තෙවැනි වසර - භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය**
**2020. 04. 18**



## 16.

## කොරෝනා හැමතැනම

කවියක් ලියන්න - හිත කියපු හින්දම
හෙව්ව පද වැල් හිතේ හැම අස්සකම මුල්ලකම
තැන් දෙක තුනක
කොස්, දෙල්, අල, බතල, කොත්තමල්ලි ඇරුණම
දැන් හිතෙත් කොරෝනා ලක්ෂණ හැමතැනම

**පූජ්‍ය හතමුණුයායේ නන්දාලෝක හිමි - වීරකැටිය**
**සිව්වන වසර - පාලි හා බෙද්ධ අධ්‍යයනාංශය**
**2020. 04. 19**

## 17.

## ගැබ්බර මවකගේ සිතුවිල්ලක්

පැතුමක් විලසින් දෝත දරා - නුඹ ගැන සිතා දිවා රැයේ
සිහින දැක්කා අපූරුවට
ළය පුරා කීරි ගැහෙනා - නුඹ නමින් උපන් සෙනෙහස
දරා ගත්තෙමි මම අපූරුවට

කිරි සිහින ගැන මතක - මගෙ හිතේ පුරෝගෙන
මැවුවා උඹෙ රුව මා හද තුළ
ලෝකය ම ගිලන් වෙලා - ගල් ගැසී බලා ඉන්නා මොහොතක
උඹ එන්නෙ කොහොමද මගේ තුරුලට

**ආර්. ඒ. එස්. සෙව්වන්දි - රත්නපුර**
**සිවුවැනි වසර - සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය**
**2020. 04. 20**

18.

## කොවිඩ් වසංගතය

තුරුවැල් බිම් හෙලා වන ගොමු වැනසුවට
මිනිසුන් බිලි ගනියි දස දහසින් දිනයකට
කාසි සොයා හැල්මේ ගිය මිනිසුන්ට
මරුවා පෙනී ඇත මේ ටික කාලයට

තම නෑසියන් සිහිකරමින් දනන් හට
ලෝකය වටා පැතිරීගිය රෝගයට
ධනය බලය මානය බිඳිමින් සොඳට
මනුදම් හුරු කළා වනගත වූවන්ට

තම පණ නල පුදා මව් දෙරණත රැකගන්ට
නොපෙනෙන සතුරාට එරෙහිව නැගිටින්ට
අවියක් ලෙසට මනුසත්කම ගෙන අතට
දෙවිඳුන් බුදුන් වැඩ ඇත මේ මව්බිමට

බාධක මැදින් රට කරනා රජිඳුන්ට
වෙද හෙද පොලිස් හමුදා නිලධරයන්ට
ආයු බල වීරි වඩවා රැක දෙන්ට
සුමන සමන් දෙවිඳුනි බාරයි නුඹට

**වී. ජී. තිළිණි ප්‍රබෝධා - මාතර**
**තෙවැනි වසර - ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය**
2020. 04. 21



19.

## නිරෝධායනය

කොරෝනා නුඹ - ඔව් මම තමයි
යමන් මා එක්ක ඇසුණේ එපමණකි
ඇයව
නැහැ නුඹ පමණයි

ඔන්න තව එකෙක් ගෙනාවා යම රජුනි....
බලන්න අකවුන්ට් එක තව ඉන්න පුළුවන්ද
ඔව් පුළුවන්

එසේනම් වහා නැවතත් යවනු...
මහත්තයා ආවද
තුනුරුවනේ පිහිටෙන්
සනීපයි හොඳටෝම

කේ එම් ජී මධූ වීරසේකර - රත්නපුර
සිව්වැනි වසර - ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
2020. 04. 22

## 20.
## මිහිකත් මවුනි සමාවෙන්න

මිලාන වී ගිය සුන්දර මතක සිරියාව
අඩ අඳුරේම නගනා හීන් කෙඳිරිය
වේදනාවෙන් මිරිකුණු ඇගේ පපුව
පිස දමයි උණු කඳුළු කොනක සිට

මැරෙයි මිනිසුන් කළු-සුදු භේද නැතිවම
පොළෝ තලයට මහා බරක් - කප්පරක් මළසිරුරු එක පිට
දරුණුයි ලැබෙන දඬුවම් කළ වරදට
යදිමි සමා අනේ ඔවුනට කමා කරන්නට

සොබා දහමට අවනත නොවීමට
දඬුවම් ලෙහෙසි පාසු නොවන වග පසක් විය සමහර ඇත්තන්ට
මුදලට හැමදේ විසඳිය නොහැකි බව
නො මැරී විඳවන හැටි මෙලෙස
අනේ දැන්වත් සමාවෙන්න

අරුණෝදයක සිරියාව විඳගන්න
කැදැල්ලෙන් නිදහස්ව අසිරිය දැක ගන්න
සඳ පෑයු රැයක සෙනෙහසේ දොඩමලු වන්න
ඇත් වුණු දැත් යළි නොබියව එක්වන්න
අලුතින් හිරු පායා වසන්තයේ ගෙන එන්න
අනේ මිහිකත් මවුනි යළිත් අපට ජීවය දෙන්න

දමිතා සුදර්ශනී - මොනරාගල
තෙවැනි වසර - සමාජවිද්‍යා අධ්‍යයනාංශය
2020. 04. 23



## 21.
## හිනැහෙමු වස්සානෙට

විඳි දුක් සියල්ල ඉවසුවේ සිනාවෙන්ම
කාෂ්ටක පොළවටත්
අසෙනි වර්ෂා උරුම නිසාමය

නිම වී ඉඩෝරය සතුටු මල් පිදීම
ළඟලු ජීවිත අස්වැද්දුම

ඉදින් වස්සානය
පනින් හනික ඔඩොක්කෙට
හිනහෙමු වස්සානයට
නිමා කර දුක දුන් ග්‍රීස්මය

පෙම්ෂිකා පබසරණී - දෙනියාය - තෙවැනි වසර
2020. 04. 24

## 22.

# ජපුර අම්මට ලියන වග නම්

දහසකුත් එකක් වැඩ කන්ද
උහුලගෙන ආදරේ පොදි බැන්ද
තනිකම කොහොම දරනවා ඇත්ද
ඇත්තටම අම්මේ අපි නැතිව පාළු නැද්ද ?

දැනුමට කුසලතාවය ආකල්පය ගෙනා
මදිවුණා අම්මේ ආදරය සොබාදම වෙත ගෙනා
හෙටින් පායන ඉරට මල් කැකුළු පූදිනා
වසන්තය ගොඩනගමු එකිනෙකා අත දෙනා

අයුක්තිය සිදුවුණේ සොබාදම් මෑණියට
කෝ අම්මෙ දෙවිවරුන් වැන්ද අපි පෝළිමට
ඉගෙනුමට සෙවණ දුන් ඔබ පමණී සේවයට
දැයට වැඩ ඇති දූ පුතුන් දුන්නේ බිමට

දන්නවද අම්මේ,
තිස්තුන්කෝටියක් නිහඬව ගෙවල්වල
දන් රැස් කරනවා කඳුළින් පිඟන්වල
දන්කුඩ හෙටත් බෙදනා ඔරු කඳන්වල
නොවඩින දෙවියො ඇත අද සත් මහල්වල

**මීනු ගුණසිංහ - පානදුර**
**සිවුවැනි වසර - සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය**
**2020. 04. 25**



## 23.

# පොඩ් එකී අඳුරට බයයි

(ගම්වාසීන් විසින් ලයිට් කණුවක බැඳ දමන ලද මිනිසකු පිළිබඳ සමාජ මාධ්‍ය ජාලයේ පළ වූ ඡායාරූපයක් ඇසුරෙනි.)

කුලී වැඩ නෑ මාසෙකින් මට වටපිටේ හැමටම ණයයි
වැඩක් තිබ්බත් වැද්ද ගන්නෑ කොරෝනාට සේරම බයයි

දැනට සතියක් කැවෙ පොඩි උන් ගෙදර ඉඳපු ඉන්නලයි
හාල් තුනපහ ගන්න ගෙදරට හොරෙන් පොල් කැඩුවා තමයි

ගහේ බැඳලා තැලුවමුත් මට කාරි නෑ දැන් දුක හුරුයි
මේ දැනුත් මට මතක් වෙන්නේ අම්මා නැති පොඩි උන් ගැනයි

ආයෙ නම් හොරකම් කරන්නෑ හාමතේ මැරුණත් සැපයි
පහ හමාරට යන්න දෙනවද පොඩි එකී අඳුරට බයයි

**ඩබ්. ඩබ්. ශෂිප්‍රභා මධුෂානි - ගොකරැල්ල**
**දෙවැනි වසර - ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශය**
**2020. 04. 26**

## 24.
## රොබරෝසියා නුඹ

රොබරෝසියා... නුඹේ සුවඳ හමනවා සෑම සරසවි හිතකම
යාන්තමින් එළිය වැටෙන - හිරු එළියට මුවා වුණු වැහි කැට
සරසවියම නහවනවා ඇති,
නුඹ වැටුණු විජේරාමය මල් සුවඳ අරගෙන විදුදැය සිසුන් සනසන්න
පවනත් සමඟ මුසුවෙලා රහසක් සෙමින් කොඳුරනවා...
කොරෝනාව නැති දවසක ජපුරේ රොබරෝසියා වසන්තේ
විඳින්න එක්වෙන්නලු හද බැඳගත් සැවොම

ඩබ්. ඒ. බී. එම්. විජේරත්න - මිනුවන්ගොඩ
තෙවැනි වසර - දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය
2020. 04. 27

## 25.
## සරදම්

ග්‍රීස්මයෙන් බැට කෑ දෙරණත් ජනයත්
පැතුමට කැමති රිසි දෙය එක් ජල බිඳුවක්
ඉරිතලනා පොළවත් හැඬුවේ තිබහින්
ඇතුවත් බැරි නැතුවත් බැරි අපේ එක වරුණක්
ඇද හැලුණා නෙක විගසින් වර්ෂාවක්
අවතැන් කළා හවුහරණක් නැති මිනිසුන්
පිළිසරණක් නැති ඔවුනට සරදම් කළේ මොටද වැසි දෙවියන්...

අවිඳු ශනේෂ් දිසානායක - පිළියන්දල - පළමු වසර
2020. 04. 28



## 26.
## මැව්වේ සිහින ළං වෙන්නයි නුඹට පුතේ

කිරිකැටි සිනා මැවී පෙනෙයි රෑ හීනේ
මැණිකේ දැනෙනවා ඔබගේ අම්ල සෙනේ
යුද ඇඳුමෙන් වැසුණත් මගෙ සිරුර අනේ
දාරක සෙනේ හද පතුලෙන් නිතර දැනේ

කරනා විට දී ඩියුටිය මම මහ පාරේ
මාපිය මැදිව යන දරුවන් නිතර පෙනේ
රන් කඳ සිහි වෙමින් මාගේ සිත පෑරේ
දෙව් රැකවරණ මා පුතු හට ඇතැයි දැනේ

රට දැය සාමය සුරැකීමට අවැසි පුතේ
ඒ වෙනුවෙන් මුතු ඇට වැගිරෙනවා ගතේ
දිව රෑ වුවද රෑ සටහන් ඇත මසිතේ
මැව්වේ සිහින ළං වෙන්නයි නුඹට පුතේ

බී. සචිනි සුරංගිකා ධර්මසේන - බලවින්න - පළමු වසර
2020. 04. 29

## 27.
## මේ දවස්වල

වෙනදාමෙන් ඉර එබෙයි - පෙර අඹර තනිනොකර
වඩ වඩා දැඩි අව් රශ්මිය
පෙරටත් වඩා සැහැල්ලුවෙන් බැට අමෝරාගෙන

ගෘහණියක් තුළින් නැගෙයි වෙනදාට වඩා
තනිවම උයාපිහා ගෙදර වැඩ අවසන
ඉඳුල් පිඟන් තසිම් දීසි සද්දෙන් සෝදමින් නැගෙන හඬ අහිබවා
ඇතුළතින් උස්ව නැගෙන ජීවිතයේ බරපතලකම

රූප පෙට්ටියේ තනි මකන රේඩියෝව
කෑගසයි තම අඬු දිවෙන් තලු මර මරා
ධනවාදී, සමාජවාදී කඳවුරු අභිභවා ප්‍රීතියෙන් කෙමෙන්
අඩු වන මරණ අනුපාතික - දෛනික රෝගී ජීවිතවල
වගු තීරු සංඛ්‍යාලේඛන

කොලරා කාලේ ආලේ පොත් රාක්කයේ මුල්ලක
මේ කාලේ අමුතු ආලයක් ගැන හිතමින් වදවෙන
කුටුම්බයෙහි ගෘහමූලික ප්‍රාණය

ඉතින් දවසක අහවර නිදන්නට සැරසෙන
ඇස'ග උන්මීලනය
අදට වඩා හෙටක් පිළිබඳ අපේක්ෂා එහෙම්මම ය
එහෙත්, ඒ තරම් නැත මේ දවස් වල

**ඩබ්. පී. ජ්ෂණ සඳුන් කුමාර - කොම්පඤ්ඤවීදිය**
**තෙවැනි වසර - සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය**
**2020. 04. 30**



## 28.
## සුවදිනක් වේවි හෙට

නතර වී ඇති සෙයකි කාලයේ වලාකුළු
ජීවිතේ තැනිතලා කඳු මැදින් ඉගිල යන

රොබරොසියා ඇහැළ සුවඳ කැලතී හමන
සුළඟ කිම හැපෙන්නේ විත් විස සුසුම් රැගෙන

නෙක පැහැති පුළුන් ගුළි දව දවා සැඟව යන
සැදෑ අහසක විලස දැවෙයි මා සිත් අහස

එතී එන මදපවන් අතේ එවනෙමි පැතුම
සුව දිනක් වේවි හෙට තවත් නොහෙළමු සුසුම්

**ඒ. ඩී. බී. ඩී. කාරියප්පෙරුම - හෝමාගම**
**තෙවැනි වසර - සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය**
**2020. 05. 01**

## 29.

# කොරෝනාවට තිත තබමු

සොබාදම් මව් නොමැරී මිය යන - ඇගෙ අඳෝනා අපට නොඇසෙන
මනුගුණ බෝ දුරක් ගෙන ගිය - කලක් තිබුණා කාසි මුල් වුණ

සිනාසී තිබූ උවන් කළුකර - කළු වලාවක් දසත පැතිරුණ
සොබා මව නැසූ කර්ම පළ දෙන - කාසි පරදා කොවිඩ් රජවිණ

සියල් සම්පත් අතර මනුසත - දෝලනය වූ අරුමැසිය සිඳ
එකට එක් වී යදම් බිඳහැර - සිතින් එක් වී කයෙන් වෙමු දුර

කුසේ දුක කිසිදා නොවන්නට - සිතේ සැනසුම යළි ගෙනෙන්නට
තිරසරින් ලොව යළි තනන්නට - පිළිපදිමු සුව නීතී අකුරට

එම්. ඩී. ඒ. සෙව්වන්දි - හොරණ - තෙවැනි වසර
2020. 05. 02



## 30.

# ඔන්ලයින් ඉස්කෝලේ

කොරෝනා කරදරය මැද්දේ ඉස්කෝලේ දොර වැස්සුණා
අඳෝනා දුක් ශෝක අස්සේ මමත් ගෙපැලට හිර වුණා
බලෝනා හිත හීන අද්දර තිගැස්මක් තවත් ළංවුණා
සදෝනා ඔන්ලයින් පාසල මගේ ඇස් හොල්මන් වුණා

නගරෙ වැඩබිම දහඩියට පඩි නැතුව අප්පච්චිට ඉඩක්
ලෙඩ ඇඳේ ඉඳ බතට ලිප් බැඳ අම්මාට නැත නිදහසක්
ඒක හින්දම කන්ද අද්දර හේනකට තබලා පයක්
වැස්සුවා පොත මගෙන් ඈතට කරන්නට ඇත වැඩ ගොඩක්

රූප පෙට්ටියේ උගන්වනවලු ටීචලා ඇවිදින් හුඟක්
මමත් දන්නේ කීව පසු පන්තියේ හම්බුණු යාළුවෙක්
ගෙදර වැඩ එක දිගට දෙනවලු ඉස්කෝලෙ යනවලු ලොකු වැඩක්
කොහොම හරි ඔන්ලයින් එන්නලු ඒක මට ලොකු හීනයක්

අම්මගේ ලෙඩ තුණ්ඩුවට බෙහෙතක් ගෙනෙන්නට කඩපිලෙන්
ඔන්ලයින් ඉස්කෝලේ දැක්කා යද්දී වීදුරු ජනේලෙන්
හිතේ අහිතක් කුමට අද මට පෙඟුණු ඇස් හැර කන් දෙකෙන්
දන්නවද දැන් අසමි පාඩම් රුහුණු සේවා තරංගෙන්

එම්. එම්. තාරක ප්‍රභාත් ජයසුන්දර - බලංගොඩ - දෙවැනි වසර
2020. 05. 03

## 31.
## පාස්කු ඉරිදා

පාස්කු ඉරු දින සසල කළ හදවත් පසුගිය දින
අවිගත් ත්‍රස්ත්‍රයෝ කැල - කළෝ දෙව් මැදුරු ලේ විල

පාස්කු ඉරු දින ගොළු කළ හදවත් අද දින
අවි නොදරාගත් අදුසුමන් ත්‍රස්තයෙක්
කළේ දෙව්මැදුරු හිස් වුණ
දෙවියන් වහන්සේ කළ පරීක්ෂාවක්දැයි නොදනිමි

එදා ඔබවහන්සේ එම දින මානව සංහතියේ ගැලවුම පිණිස
කුරුස මත තැබූ දෙව් සිරුර කියාදුනි දයාවේ පාඩම

හැකිය අපහට අද දින දෙව් මැදුරු නොයා සිටිනට
කොරෝනා වඳුරු රෝගය සුනුවිසුණු කර දැමීමට
එදා ඔබගේ දයාවේ පාඩම කිතුනු බැතිමත් සිතින් අප සැම
නිවසටම වී යදිමින පතමි ලොවේ සතුනටම සැනසුම

ඉමල්ෂා නවරත්න - බලන්ගොඩ
සිවුවැනි වසර -
භාෂා සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසාංගික කලා අධ්‍යයනාංශය
2020. 05. 04



## 32.
## හීන්දෑරී කතක්

හීන්දෑරී කතක්
කඩිමුඩියේ පල්ලම් බසින්නී
නිතර වටපිට බලන්නී - විටින් විට උඩ පනින්නී
ලෙයට මැසිවිලි නගන්නී

නැත පයෙහි දැවටෙන යමක් - නැත දරු පැටවුන්ට අලයක්
නැත කොත්තමල්ලී ඇටයක් - ඇත හිතේ කොරෝනට බයක්

හිසි පිසින මඩ තැවරුණු දෑතක්
වැහැරී දහඩියට පෙඟුණු කෘෂ ළැමක්
මලානික කඳුළු දුක්ඛිතම දෑසක්
සුසුම්ලන හදවතක් සතු ඇයත් කතක්

සිතින් සවිගත් ගතේ ඇත වීරියක්
මවන්නේ ඇගේ රූ අබියසින් කැඩපතක්
කිරට මොර ගාන පැටවුන්ට වී මවක්
ඇයත් රන් මුදුවක් නොලද අප්සරාවක්

**ආර්. ඒ. එම්. එස්. සෙව්වන්දි - බලන්ගොඩ - දෙවැනි වසර**
**2020. 05. 05**

## 33.

## ඇඳිරි නීතියේ අපි

සුපර් මාර්කට් එකේ රෝද හතරේ ට්‍රොලියේ
කරක් ගහපු අපිනේ අද ඇඳිරි නීතියේ
කොරෝනා උඹ නිසාවට ලොරි එනවා ගේ ගාවට
සුපර් මාර්කට් එකේ සුවඳ නොදැනී අපට සංකාව
අපි ගෙදරට වෙලා ඉඳන් පරද්දනවා උඹේ හිනාව
බලාගන්න අපි එදාට බය නැතිව බහිනවා එළියට

එල්. එල්. ඞී. ඞී. ඊ. රූපසිංහ - පිළියන්දල
සිවුවැනි වසර - ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය
2020. 05. 06

## 34.

## වෙසක් කූඩුව

රැලි සැලී දිලෙන විට හරි අගෙයි උස අත්තේ
තරු අතර පායපු සඳ වගෙයි පුර හඳ අහසේ
උණ පඳුරු පළ පළා අප්පච්චි ඒ කාලේ
වෙසක් කූඩුව හැදුවා තවම ඇත සිතෙ මාගෙ

කාලයක් ගතවෙලා මම කොළඹ තනි උනා
අප්පච්චි මැටි පිලේ පන් පැදුරේ තනි උනා
කොළඹ රට වට කරල ගිණි පඳුරු හිනහුණා
උණ පතුරු කූඩුවේ රූපේ ඉන් කළු උනා

බුදුරුපේ වටකරපු සිය වර්ගෙ පූජාව
සණ්ටාරේ හඬ තාම ඇසෙනවද ගම්මානේ
ලණු ලෙහී හැඩ ගැසී ගිණි ගත්ත කූඩුවේ
අප්පච්චි ජීවිතය ඇන්ද නුඹ පාඩුවේ

හෂාන් කේ. විජේනායක - නිකවැරටිය - දෙවැනි වසර
2020. 05. 07



## 35.

## කොරෝනා කාලේ සමරමු වෙසඟ

ලෝකයේ යථා රූ මනුසතට පහදන්න
කල්ප ලක්ෂයක් පාරමී බලයෙන්ම
සාගරය තරම් ලේ ඇස් මස් ද දන් දුන්න
තථාගත අප සමිඳු උපත අද සමරන්න

මුතුමැණික් පිරිවෙන් රජ සැපත අත්හැරිය
පුංචි රාහුල කුමරු හැරදමා ආ ගමන
පලඟනා ගියා මෙන් උඩුගංව ගඟ දියඹ
දස මරුන් පරදවා බුදුවීය මේ වෙසඟ

සතන්හට ලොව බලා දෙසූ දහම් උත්තමය
සෝපාක බඳු දහස් මිනිසුන්ව සැනසීය
දසදහස් වසරක්ම ලොවේ පවතින සත්‍ය
දෙසූ ඒ සමිඳාණ පිරිනිවන වූ දිනය

ලොවේ ඇති අනියතය දැස් අද්දර මැවෙන
ආමිසය ප්‍රතිපත්ති නිවසේම සපුරන්න
ශ්‍රද්ධාව හදවතේ නොවෙනස්ව උතුරන්න
පුරමු අපි පාරමී නිවෙන්නට සසරෙන්ම

වී. එම්. පී. හර්ෂණී - බදුල්ල - දෙවැනි වසර
2020. 05. 08

36.

## අහිමි වෙසගේ අසිරිය

පෙර විලස නැත, කූඩු සහ තොරණ..
පාළු මාවත් හඬා වැලපෙයි..
නැත, කිසිත් ආලෝකයක්..
වෙසක් අසිරිය ලොවට පෑමට
නැත, කිසිදු ඉඩකඩක්.. කොරෝනා නුඹ,
අහිමි කෙරුවා.. වෙසක් අසිරිය අප සැමටමත්....

ඕ. කේ. ඩී. ඉසුරි වාසනා - ඇල්පිටිය
තෙවැනි වසර - දේශපාලනවිද්‍යා අධ්‍යයනාංශය
2020. 05. 09

37.

## සිල්

විහාරේ දොරකඩ ළඟ සිට නැගෙන අමුතු භක්තිය
රැඳෙන්නේ පැය දෙක තුනකට
සිල් ගත්තට වැඩක් නැත ඉන් එහෙම......
හීල් දානේ වැළඳූ පසු සොයයි ඒකේ අඩුපාඩු
හාමුදුරුවෝ වැඩි පසු දණ ගහමින් කියයි සාධු
මතක නැත සිල් ගත් බව පිරිසකට
කියයි හාමුදුරුවෝ නැති විට
බණ වෙනුවට උපාසක අම්මලා වෙන අයට
අහල පහල වගතුග අපූරුවට......
පිරුවට ඇඳ ආවත් උදේම යන්නේ හවසට කිළිටි කරගෙන
උපාසක අම්මලාගෙන් සමහර නගයි දොස් දැන් මේ මා හට....

පැතුම් හෙට්ටිආරච්චි - මහ ඉඳුරුව - දෙවැනි වසර
2020. 05. 10



38.

## වන්දේ වන්දේ තිලෝගුරු පියාණෝ

මොහාන්ධකාරයේ වෙළී වැසී ගිය තිලෝ සතහට
කරුණාවේ දහම් අමා ගඟ - සොයා සැනසුම උදා කරවූ
උතුම් සම්බුදු පියාණෝ වන්දේ වන්දේ තිලෝගුරු සම්බුදු පියාණෝ

තිලෝසත මුදවම් දුකෙන් - සොයාගම් මග අදටනින්
සක්විති සැප නම් කිමැයි කියා - මහරු සැප සම්පත්තිය සොයා
මහබිනික්මන වෙත සැරසුණා

දස මරුන් පරදා මෙතින් - අරිඅටඟි මග පුරා වීරියෙන්
උතුම් වෙසගේ ලෝ දිනූ තථාගතයාණෝ
වන්දේ වන්දේ තිලෝගුරු සම්බුදු පියාණෝ

පන්සාලිස් වස පුරා ගම් නියම් ගම් සැරිසරා
උතුම් දහමින් ලෝ සතුන් සනසවා වදාළා
උතුම් සම්බුදු පියාණෝ

අසූ වියැති වස සපුරමින් ලෝ සත නිවනේ සලසමින්
බව කතරට තිත තැබුවා උතුම් සම්බුදු පියාණෝ
උතුම් වෙසගේ පුන්සඳ එළියේ
ආමිස ප්‍රතිපත්තියේ මග දරා බැතියෙන්
උතුම් තෙමඟුල සමරමු බැති සිතින්
වන්දේ වන්දේ තිලෝගුරු සම්බුදු පියාණෝ

**ජේ. පී. ඉෂානි - තංගල්ල - දෙවැනි වසර**
**2020. 05. 11**

## 39.

## නොලැබුණු වෙසඟ

මිනී ගොඩක් මැදින් මල් මිටක් ගෙන
කෙසේ නම් පුදන්නද සමිඳුනේ
පුර හඳක් පායා ඇතත් අද අමාවක ලෙස මට හැඟෙයි
අහස් කුස අද අඳුරු නොවුණත් සිය දහස් ජීවිත අනේ
මර බියෙන් අද හඬා වැළපෙයි ජීවිතේ යදිනා සිතින්
ලබන පෝයටවත් අපට එක්වන්න හැකිනම් පෙර ලෙසේ
ඔබේ පිහිටයි අවැසි සමිඳුනේ රකින්නට මේ ලෝ තලේ

එච්. නෙත්මි සාරදා - වැල්ලම්පිටිය - පළමු වසර
2020. 05. 12

## 40.

## මුලාව

| | |
|---|---|
| නෙත් බෝම පිනවනා වර්ණයෙන් හැඩ | කළා |
| කුඩු දෙකකට නොයා දහයක්ම | අලවලා |
| හිතට හොඳ මදි නිසා රැළිත් තව එක් | කළා |
| එල්ලුවේ ලොකු ගහක හැමෝටම | පෙන්වලා |
| ළගම එන වැස්සක්ය පෙර නිමිති | සැලවෙලා |
| ඇද හැලුණු පොද සැරට හිතම කලබල | වෙලා |
| දිව ගියෙමි ගහ යටට කුඩු වෙත | පියඹලා |
| අනේ කියවුණා මට නවයක්ම දිය | වෙලා |

හිරුණි අමංගා දිසානායක - අනුරාධපුර
දෙවැනි වසර - ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශය
2020. 05. 13



## 41.

## ස්වභාව ධර්මය ජීවිතේ

ජීවිතෙත් මේ අතැඹුලක් නම්
ගන්න හුස්මත් කොහි ගියේ
එදත් දන්නෑ අදත් දන්නෑ
වා කවුළු කොහිදැයි කියා
සංසාර ආරණ්‍යයේ...

රුදුරු රෝ බිය ඇස් වසාගෙන ඇහි පියන් යට වහන් වී
පෙනෙන නොපෙනෙන රැඳෙන් සිතුවම
අසරණයි සම්බුදු සමිඳුනේ
නිවනේ මොක්පුර තාම නොදැනී මගේ සම්බුදු පියාණේ
කවුරු කොහොමින් කවදා මැව්වෙද ස්වභාව ධර්මය ජීවිතේ

අරිය සත්‍ය අරිය අටමග තවම ගෙත්තම් කරන්නේ
මාත් නොදනී ලොවත් නොදනී කතරෙ කෙම්බිම සොයන්නේ
යළිදු බුදුමෙත් සිසිල පාලා වඩිනු මැන ස්වාමීනේ.....

ඔ. වී. පී. කාවින්දි - අගලවත්ත - පළමු වසර
2020. 05. 14

## 42.

# සසර බැමි දුරලමු

| | |
|---|---|
| මෙය මගෙ කියා ලොබ සිත් ඇති කර | ගැන්ම |
| තරහව වෛරයට පෙරළා පළි | ගැන්ම |
| සසරෙහි බැඳෙන බැමි තද කර බැඳ | ගැන්ම |
| නිවනට දුරයි සසරට ම යි ඒ | බැම්ම |
| | |
| සතුනට සෙනෙහෙ නො අඩුව | පිළිගන්වන්න |
| නැදිමලයන් සේ ම සැම සත | සලකන්න |
| මෙත් සිත පෙර දැරිව හද සරසා | ගන්න |
| එතකොට හැකි වේවි දුක දුරු | කරලන්න |
| | |
| මෙය නැවතුමක් පමණක් බව | සිහිගන්න |
| සන්සුන් සිතින් දැසම හැර | විමසන්න |
| ඇති-නැති පරතරය සිහියට | අරගන්න |
| ලත් මනුබවය පිං කරනට රැක | ගන්න |
| | |
| දැනගෙන ගියොත් නිවනට දුර වෙයි | අල්ප |
| නො දැන ගියොත් සසරට වෙයි තව | බැම්ම |
| ඇති හැම විට දි අනෙකා ගැන | වෙහෙසෙන්න |
| මතුවට සැනසීම උදෙසා දන් | දෙන්න |

සෂිනි ගුරුසිංහ - මතුගම - දෙවැනි වසර
2020. 05. 15



## 43.

# බලාපොරොත්තුව

ඉමක් නොපෙනෙන සිහින අරගෙන
ජපුර සෙවණට ඇවිදින් පුරා වසරක් ගෙවුණා..
තෙරක් නොපෙනෙන පැතුම් බිඳගෙන
වසංගතයක් ආවා..
අදින් ඉවරයි කියා සිතුවත්
කොනක් නොපෙනෙන ගානයි
තුරුණු සිත් බැඳි සිහින ගෙත්තම්
ගොතන්නට කල් බොහොමයි..
මාපියන් දුක් විඳින්නට වන
කාලය ද තව දුර යයි
ඉතින්, මෙතෙකැයි කියන්නට බැහැ
හදෙහි ඇතිවන දුක් නම්..
පැතුම් පොදිගෙන ඉතින් හැමදින
බලා ඉන්නම් ආයෙත්
ගුවන් ගමනින් ඉගිල එන්නට
ජපුර සෙවණට ආයෙත්..

එම්. ඒ. ඩී. ප්‍රියදර්ශනී - ගාල්ල - දෙවැනි වසර
2020. 05. 16

## 44.

# අපූරු පාඩම

ලොවම වෙනස් වී ඇති බව ස්ථිරයි
හේතුව කුමක්ද යමෙකු විමසුවොත්
පිළිතුර සරලයි අකුරු කිහිපයයි කොරෝනාව එහි පිළිතුර වේ

කොරෝනාව හරි පුදුමාකාරයි
බලවත් කීවද දුර්වල කීවද කිසිවකුත් නෑ අතහැර දැමුවේ
සියලු දෙනා එහි නතුකර ගත්තේ තොරවයි කිසිවකුගේ අනුදැනුමින්

දස දහසින් ලොව අතහැර යන මිනිසුන්
පොරබදින ජීවිත සොයමින් තව පිරිසක්
මරණ බියෙන් තැති ගත් තව කොටසක්
කොරෝනාව හා බැඳී ඇතේ
වන සිවුපාවුන් නගර කරා එයි
සිය නිදහස රිසිසේ භුක්ති විඳී
නගර පාලු වී මූසල පෙනුමකි අද
නිවසට කොටු වූ නිහඬ ස්වරූපයෙන්
හමාරය මිනිසුන් අද සිරකරුවන් වී

ලොවම වෙනස් කර කොරෝනාව
ස්වභාව ධර්මයට නිදහසක් මෙන් ම
මිහිකතට විවේකයක් ලබා දී
මිනිසාට හරි අපූරු පාඩමක් කියා පා
ලොවම ගොදුරු කර නිහඬ ව ඇත

කේ. ඒ. එස්. මලින්දිකා ධර්මසිරි - ගිරාඳුරුකෝට්ටේ
සිව්වැනි වසර - ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
2020. 05. 17



## 45.

# විස්සේ නිවාඩුව

වසර ඇරඹෙන්නටත් කලියෙන් - දින දසුනේ රතු දිනම සොයමින්
ඇති නිවාඩුව ඇඟිලි ගනිමින් - විස්ස අපි පිළිගත්තේ සතුටින්

විස්ස ලැබුණා කිරි උතුරවමින් - වෙනදා මෙන් අසිරි නැගෙමින්
ගතවුණේ ටික කලකි විස්සෙන් - කසු කුසුව එයි චීනේ පැත්තෙන්

සත්තු කාලා චීනේ ඇත්තන් - හදා ගෙනලු මහා ලෙඩ්ඩුන්
අනේ ඕකුන් හිරි කිතයි දැන් - දැම්මේ සෝෂල් මීඩියාවෙන්

කැස්ස සෙම් සොටු හදා ගෙන දැන් - අපේ එවුනුත් බයවෙලා මෙන්
කොරෝනද දන්නෑ අපිට බං - විහිළුවක් වී ඇත උන්ට දැන්

විහිළු හැම දා නැත තිබෙන්නේ - විස්සේ දෙමසක් ගොස් තිබෙන්නේ
ලෝකෙ එක එක රට වසන්නේ - කොරෝනාවයි ලෝකේ ගිල්ලේ

හෙළදිවත් ටික ටික වැහෙන්නේ - මිනිසුනුත් ගෙතුළම ලගින්නේ
තුන් හාර මස පසුව යන්නේ - නිවාඩුව දැන් එපා වෙන්නේ

එම්. එස්. මැදගමගේ - හොරණ
තෙවැනි වසර - මානවවිද්‍යා අධ්‍යයනාංශය
2020. 05. 18

## 46.
## මිහිමවගේ දඬුවම

විශාලාවක් වී ඇත මුළු ලොවම අද දිනේ
රුදුරු බව මෙතරම් ඇයිදෝ මිහිමවුනි මගේ
නුඹේ දරුවන් හඬා වැලපේ සෝ දුකින් අනේ
බලා අප දෙස දයාබර නෙත සනසවනු මැන මිහිමවුනි අපේ

**කේ. වී. ටී. මල්ෂා - මීරිගම - පළමු වසර**
**2020. 05. 19**

## 47.
## නැවතුණු හීන

ඇවිද ගිය මග අදත් පාළුයි හීන ඇත මග නැවතිලා....
පොදි බැන්ද මතකය මැවෙනවා මිතු කැල සමඟින් හිනැහිලා....
ඔහේ ගලනා සිතුවිලි අමුණා දිග හැරෙන පද මුමුණනා....
යළිත් අප හමු වන්නේ කවදද ජපුර අම්මා තනිවෙලා....

කොහෙන්දෝ ආ රුදුරු වෙසසක් වෙළාගෙන ලොව සිව් දෙසින්....
තවත් වසරයි නික්ම යන්නට විදු මව් තුරුලින් බැස යමින්....
සරසවියේ අවසන් මතක ටික එකතු කර ගන්නට තුටින්....
පෙනෙන දවසක් කවදා ඒවිද බලන් ඉන්නම් මං ඉතිං....

**බී. එම්. ආශිංසනා බණ්ඩාරනායක - මහනුවර**
**තෙවැනි වසර - අපරාධවිද්‍යා හා අපරාධ යුක්තිය අධ්‍යයනාංශය**
**2020. 05. 20**



## 48.
## රොබරෝසියා පලස

සොඳුරු පාසල් දිවිය නතර වූ තැන් පටන්
හද පුරා වැජඹුණේ හන්තාන පෙම් අරණ

සිතුවේ නෑ කිසි දිනක රොබරෝසියා සුවඳ
කස ගහේ පෙම් හැඟුම් මෙන් දැනේ කියා

ගෙනා මුත් පොදි බැඳන් සිනිඳු මුදු සිහින මලු
ලිහා දිගහරින්නට නොහැකි වී ගිය නමුත්
ලියමි අදටත් නුඹේ නමට සෝ ගී තැවුල්

විජේරාමෙන් හැරී නුඹ සිටින මං ඉමේ
රොබරෝසියා පලස පිනවුයේ නෙත නොවේ
නිදා සිටි හදවතයි

**කේ. සඳුන් බුද්ධික ද සිල්වා - උඅරගස්මංහන්දිය - පළමු වසර**
**2020. 05. 21**

## 49.

## මග බලන සිහින

කලු ලෝගුවට පෙම් බැඳි දා සිට
සිහිනයක් විය සරසවි මතක
පොදි බැඳන් ආ ජපුර බිම වෙත
සිහින කඳ මලු ගොන්න
මිරිඟුවක් වුණාදෝ ඒ රොබරෝසියා අරණ
කඳ මලු ලිහා ගැනීමටත් පෙරම තවම මග බලයි සිහින

නෙරංජලා සංජීවනී - නිට්ටඹුව - පළමු වසර
2020. 05. 22

## 50.

## ප්‍රතිපත්තියේ ගිලෙමු

පන්සලේ සණ්ඨාරෙ හඬ නොමැත වා තලයෙ
සුදු වතින් සැරි දනන් මහ මගේ කළුතික ය.
විසල් තොරණින් නැගුණු හන්දියේ උජාරුව
දන්සැලක් පෝලිමක් මීටරෙන් වත් නොමැත

ගෙන්ගෙට ගලා යන සිල් සුවඳ අඩු නොමැත
නිරෝධායන වෙමින සැරසුවයි පිළිවෙතින
බුදු හිමින් වදාලූ මග යන්ට මේ වෙසඟ
ආමිසයෙන් වෙන්ව ප්‍රතිපත්තියෙන් දකිමු.

තරිඳු ලසන්ත - බෙන්තොට - පළමු වසර
2020. 05. 23



## 51.

## අලුත් ටීචර්

සිනාවක් ඉනාවක් ඒක දිග කතාවක්
අකුරුවල ඇමිණුමක් පුංචි දෙව් ලෝකයක්
කහපාට ගවුමකින්  ගෙවුණු බාටාවකින්
මලක් ඇත සරසලා පාන්දර පාසලක්
ඉරි මැකුණු පොතක් ඇයි ඊයෙ ලිව් පිටුව කොයි
අබලි මල්ලකුත් නැත තෙමුණු පොත් සගවන්ට
කඩල ඇට දෙකතුනක් දවල් තේ මේසයක්
ලොකුම ලොකු හරි උඩින් මැවෙන රන් හිනාවක්
අකුරු පිටු තිත් උඩින් පියඹලා මතකයන්
අලුත ආ ගුරුතුමී හිනැහුනා හදවතින්
කහ ගැහුණු සුදු ගවුම් වුණා කහ සාරියක්
කැලේ පිපි පුංචි මල් නුඹත් වාගෙයි මමත්
හොරු ගන්න බැරිම දේ තිබුණොතින් නුඹ ළඟින්
තෙමුණු තැන් ඉරුණු තැන් වේවි ලොකු චිත්‍රයක්

වී. එම්. පී. හර්ෂණී - බදුල්ල - දෙවැනි වසර
2020. 05. 24

## 52.
## ජපුර මව නිහඬයි

ගින්දර වූ ඒ ගොම්මන් රත් අහස උඩින්
උසට උසේ වැඩී තියෙන රෝබරෝසියා මල් ගස් අස්සෙන්
හද සෙනෙහේ අප හට පෑ අනේ අපේ සුමංගලේ
පාළුව තනිකමයි හද තුළ සිර කර ඉකි බින්දේ

සුසුම් උඩට මෝදූ වෙමින් දින යැව්වේ
වෙසක් දිනෙත් උදා වුණා වෙනදා මෙන් නෑ කවුරුත්
පැතුවා වෙනදා මෙන් සැරසී බැබළී සිටින්න
ඇයි දරුවනේ ජපුරේ මව මෙලෙස වැලපෙන්නේ

දරුවන් වෙනදා මෙන් නොව නිශ්ශබ්දයි
ජපුර මවත් නිහඬයි තනියෙන් පාළුයි
වෙනදා මෙන් නොව මේ පුරපසළොස්වක පෝයේ
ආයේ නොරිද්දන්න මා සිත් මේ ලෙසිනේ

අචිනි ලියනාරච්චි - කොළඹ - දෙවැනි වසර
2020. 05. 25



## 53.
## බාධක

එකක් අවසන තව එකක් නිමාවන්නට නෑ වගක්
දරාගන්නට මෙපමණක් හැකි ද මෙලෙසින් තව කලක්

වසංගත ලෙඩ රාශියක් කරයි ලොව තුළ සක්මනක්
ලොවම බියපත් කළ ලෙසක් දුබල වී ඇත ලොව අඩක්

දිනාගන්නට මහ මෙරක් පැතුම් ඇත සිත කප්පරක්
පසුතැවෙන්නට නෑ ඉඩක් නැගිට ජය ගමු නව ලොවක්

එල්. රූපසිංහ - රත්නපුර - දෙවැනි වසර
2020. 05. 26

## 54.
## නොදකින යථාර්ථය

කලක් තිස්සේ, ඉරිතලා ගිය ගොහොරු බිමකට
අහම්බෙන් මෙන් පැමිණි දියපොද,
සියපත් විකසිත කරන්නට වූ නමුදු
පැමිණි දියපොද කොහෙන් ආවාදැයි නොදකින මුත්,
එහෙත් එය විලක් වන බව ගොහොරු බිමම දනියි නම්,
ඉතින් අරුමයක් ද, නොදැකපු හදවත් එක්වන්නට වීම.......

ඒ. එම්. කේ. විරාජිනී - කැකිරාව
සිව්වැනි වසර - ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
2020. 05. 27

## 55. විභාග

ශිෂ්‍යත්වෙත් පාස් උණා ලොව ම දිනුවෙ එදැයි කියා
පුංචි සිතට මගෙ සිතුණා කාලය ගතවෙලා  ගියා
ආයෙ මාස තුනෙන් අම්මා මාව ඇදන් පන්ති ගියා
තව විභාග ඇතැයි කියා - ඒව සමත් වෙන්න කියා
කඩඉම් පත්තර ලියුවා විෂයන් නවයක් උදෙසා
මාව ඊට හුරු කරවා සමත් වෙන්න පුතේ කියා ඒකත් ඉවරයක් වුණා
ඔක නොවෙයි ඒකයි පාස් වෙන්න ඕනෙ කියා
ආයෙ මාස තුනෙන් අම්මා කතා කරල මට කීවා

නින්ද නැතිව රෑ තුන්යම දවල් දවස ටියුෂන්වල
හීන ලෝකෙ පේපර්වල ජීවිතෙ මගෙ ගෙවිලා ගියා
ග්‍රහ අපලත් ඇතැයි කියා නූලක් මතුරල අම්මා
විභාගයට කලින් දවසෙ බෙල්ල වටේ ගැට ගැහුවා

විභාගෙ අවසන් වූවා මේසෙ තිබුණු පොත් ඔක්කොම
අහකට කර මං තිබ්බා දැං නම් නිදහස් සිතුණා
විභාගෙ ප්‍රතිඵල දැක්කම හෙලපු සුසුම් මිලින වුණා
ජීවිතය ම දිනුවා වැනි හැඟීමකින් සිත පිරුණා
මැදින් මාසෙ මැද දවසක ජපුර මවගෙ ඇකය බලා
උජාරුවට අම්ම එක්ක මට මතකයි පිය මැන්නා
.... නිවාඩුවට ගෙදර ආවෙ සතුටු සිතින් ඉන්න කියා

විභාගයක් එනවා නේද නොවුණොත් එගොඩට ඔතතින්
ගඟට කපපු ඉණි වගේ ය මොකක්ද යන කලදසාව
ආයෙත් අම්මා කීවා පොතක්පතක් බලාගන්න
මොකටද මං මැව්වෙ හීන ඉක්මනට ම ලොකු වෙන්නට
මට නම් දැං යන්න ඕනෙ  බහ තෝරන පොඩි වයසට
විභාග නැති ඒ කාලෙට

එස්. ගුරුසිංහ - මතුගම - දෙවැනි වසර
2020. 05. 28



## 56. මැදින් ප්‍රේමයේ නිරිතදිග මෝසම්

මල් පිපෙන මැදින් මහ ආදරෙන් අරන් නුඹ
කෝඩු බඹසර සිතේ නුහුරු ලෙස ලැගුම්ගත්
පූදිනා බක්මහේ එළඹෙනා නක්කත්තේ
නුඹ දුන්නු ආදරෙන් ගැහෙනවා හද තවත්

පින්සාර වෙසක් මහ බරසාර නො වූ පෙම්
හැඩකාර තුරු හිසින් ගිලිහුණේ දැරු එලත්
මෝසමින් නිරිතදිග නා කපන වැහි එද්දි
කඳුළු බිඳුවක සීත දනීවිද මිහිකතත්
මතක පොඩි ඔප දමන තව කඳුළු බිඳුවකින්
ගලාවිද පිට දෝර ගලන ගංගා වුණත්

එම්. කේ. අනුෂ්කා කුමාරසිරි මල්දෙණිය -
ගිනිගත්හේන - පළමු වසර
2020. 05. 29

## 57. දුර යන හීන...

මතක සැමරුම් ගොන්නක් එකතු කර ගන්නට හිත දරන්..
සිව් වසරට අප පා තැබුවේ කප්පරක් හීන ගොඩ ගහන්..
කොරෝනා නුඹ ආවා වසංගතයක් නමින් අපේ හීන බොඳ කරන්..
දවසින් දවස මේ ගෙවී යන්නේ
ජ'පුර අහසේ ගෙවන්නට තිබූ ලස්සන දවස්..
දිනෙන් දින අපේ හීන දුර යනෙන හින්දා
දරා ගන්නට බෑ තවත් මේ දුක් සුසුම් කඳුළු ගංගා
දැන්වත් ඇති කොරෝනා නැවතියන් නුඹ සදහටම
රන් ලෝගුවෙන් හැඩ වෙන දිනය ළං කරමිනා..

එම්. සචිනි ලක්ෂිකා - මාකොල
සිවුවැනි වසර - දේශපාලනවිද්‍යා අධ්‍යයනාංශය
2020. 05. 30

58.

# ජයවද්දනපුර වන්නම්

විදුරමණිය කිතුගොස නැගි පෙරඹරින
කිරි සයුරින ගෙන ආ සිප්කිර පොවන
ගරු බුහුමන ලොව දස'තින ලද නිතින
ජයදදයෙන සැදි පුරවර පුරයි මන

හිරු තෙදයෙන බල ලැබ කෙළිබිම ඔබින
රණ මදයෙන සහසක් දන පරදවන
සක් නදයෙන විස්කම් දෙව් මවිත වන
ඇත් පැටියන සිටියා කෙළිමින් සරණ

අඟන සුරන් වුව මන්මත් වන ලෙසින
රැගුම් මඩුළු බිම කිංකිණි වගුරවන
සැලෙන පහන්සිළු වන් රංගනාවන
ගයන පසිළුවන ගීයෙන සැදි පවන

කුලවද්දන දරු කැළ දුරු රට යාද
හිරුවද්දන සූරිය මල් නොපිපුණිද
සිරිවද්දන බෝ මුල කිසිවකු නැද්ද
ජයවද්දන මව්, තනිකම දැනුණා ද

එම්. ඩී. භාග්‍යා විහාරා සෙව්වන්දි - මතුගම
සිවුවැනි වසර - මානවවිද්‍යා අධ්‍යයනාංශය
2020. 05. 31

කාශනය
ය් ප්‍රකාශන කමිටුව
ානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ISBN 978-624-5360-13-0